# නියමුවා

"සූරාකනු ලබන හා පීඩිත ජනතාව තමන්ට පැරණි ක්‍රමයට ජීවත් වීමට නොහැකි බව අවබෝධ කර ගැනීම සහ වෙනස් කිරීම ඉල්ලීම විප්ලවයක් සිදුවීම සඳහා ප්‍රමාණවත් නොවේ. විප්ලවයක් සිදුවීම සඳහා සූරාකන්නන්ට පැරණි ක්‍රමයෙන් ජීවත් වීමට සහ පාලනය කිරීමට නොහැකි තත්වයක් ඇතිවීම අත්‍යාවශ්‍යය. විප්ලවය විජයග්‍රහණයට පත්විය හැක්කේ 'පහළ පංතිවලට' පැරණි ක්‍රමයෙන් ජීවත්වීම එපා වූ විට සහ 'ඉහළ පංතිවලට' පැරණි ක්‍රමයෙන් කටයුතු කරගෙන යාමට බැරිව ගිය විටය."

ලෙනින්

තෝරාගත් කෘති,

05වැනි වෙළුම, 19 පිටුව

ISSN 1391 - 1031 | 2023 ජූලි | 27 වෙළුම | 11 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=



## ඇසළ ඇමතුමක ඇහැරෙමි

කඩා හැළෙමින් තිබුණි තණපත්
ඉඩෝරය දිගු වෙමින්
පොළොව සුසුමක පාවෙමින්

උදම් රළක වේගෙට
වසා ගත් ජීවිත
වියළි කර්කෂ පොළොවක

නියං කුරුල්ලන් රෑන
සොයා ජීවිත තෙත
මංමුලා වූ බිම
උකුසු ඇස් මුව ළඟ

තටු ගසා ඇහැරිලා ළිහිණීන්
අලුත් අහසක් ළඟ
වැහි වලාවක ලකුණු දැන
තණපතුත් ඇහැරිණ

ඉතින් ඒ නව ඇසළ මාසය
අලුත් වැස්සක් ගෙන
නුඹ ඇවිත් තිබුණේය
අප වෙත
නව ලොවක් අරගෙන

ඇසළ ඇමතුම
නුඹය සොහොයුර
අලුත් වැස්සක් ළඟ

ජූලි 14 දිනට යෙදෙන ජ.වි.පෙ. නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයාගේ 80 වැනි ජන්ම දිනය වෙනුවෙනි...




තංගල්ල - 2023 ජූනි 13



අනුරාධපුරය - 2023 ජූනි 20

## පවුලක-පංතියක බලය රැකගන්න හදන

# ආණ්ඩුවේ ඒකාධිපති ගමන පරාජය කරනවා

ජනතාව ලබාදුන් ජනවරමක් නැවත බිහිකරන්නේ නම් එය කළ හැක්කේ ජන වරමකින්ම පමණක් බව ප්‍රකාශ කරන ජනතා විමුක්ති පෙරමුණ, විසුරුවා හැර තිබෙන පළාත් පාලන ආයතන නැවත කැඳවීම සඳහා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් ලවා ව්‍යවස්ථා සංශෝධනයක් ඉදිරිපත් කරවීම එක පවුලක, පංතියක බලය තවදුරටත් රැකගැනීම වෙනුවෙන් වූ තක්කඩි වුවමනාවක් බවත් ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව යාමට උත්සාහ කරන ඒකාධිපති ගමන පරාජය කරන බවත් අවධාරණය කරයි.

මේ අදහස් පළ වූයේ පසුගිය 29වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද කියා සිටියේය.


"මෙවැනි දේශපාලන භාවිතාවක් අපේ රටේ තිබිය යුතු නැහැ. ව්‍යවස්ථාව පැත්කට දමා, නිලධාරීන් බයකර ගත්, ඒකාධිපති භූමිකාවකට යන්න රනිල් වික්‍රමසිංහ උත්සාහ කරනවා. ඔවුන් විසින් විනාශ කළ රට මූල්‍ය අරමුදලට පාවාදී තිබෙන අතර, කූට උපක්‍රම පාවිච්චි කර, තමන්ට කලින් තිබුණු බලය, දිගටම පවත්වාගෙන යන්න ඔවුන් උත්සාහ කරනවා. ජාතික සම්පත් විකුණමින් දවස ගෙවා ගන්නා අතර, ණය ප්‍රතිව්‍යුහගත කරන්න කියලා බැංකු ටික විනාශ කරන්න හදනවා. ජනතාවගේ විශ්‍රාම වැටුප් අරමුදල්, කපාහැරීමටත් උත්සාහ කරනවා. දේශපාලනයේ යථාර්ථයට ජනතාවගේ කැමැත්තට ඉඩනොදී ව්‍යවස්ථා කුමන්ත්‍රණයකින් බලයේ ඉන්න රනිල් වික්‍රමසිංහ උත්සාහ කරනවා නම්, ඉතිහාසය කියවා ගන්න කියලා අවධාරණය කරනවා. එවැනි සෑම පාලකයෙක්ම ජනතාව විසින් බිමට දැමූ ඉතිහාසයක් තිබෙන්නේ. මෙවැනි දේශපාලන කුපාඩිකම් කර බලය තහවුරු කර ගැනීමට කිසිසේත් ඉඩදිය යුතු නැහැ. පරාජය කිරීමේ වගකීම අපට තිබෙනවා. කල්දමා තිබෙන පළාත් පාලන මැතිවරණය ලබාගන්න අපි කවුරුත් එකතු වෙමු කියන ඉල්ලීම ජනතාවට කරනවා.

රනිල් වික්‍රමසිංහ පළාත් පාලන මැතිවරණය කල්දමා හිතුවක්කාරී ලෙස කටයුතු කරන අතරේ අලුතින් තක්කඩිකමකට මුල පුරා තිබෙනවා. විසුරුවා හැර තිබෙන පළාත් පාලන ආයතන නැවත කැඳවීම සඳහා ව්‍යවස්ථා සංශෝධනයකට යාම වෙනුවෙන් ජූනි 23දා පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස ගැසට් නිවේදනයක් නිකුත් කර තිබෙනවා. කඩිමුඩියේ පළාත් පාලන පනතේ වගන්ති සංශෝධනය කරන්න

02 වැනි පිටුවට

## 03

## ආර්ථිකය කඩා වැටීම...




රනිල් වික්‍රමසිංහලාට, මහින්ද රාජපක්ෂලාට මේ රට හැදීමේ හෝ මේ අර්බුදයෙන් රට ගොඩගැනීමේ සැබෑ වුවමනාවක් හෝ හැකියාවක් නැත....


තරුණ ................ 04
සංවාදය ................ 05
කාලීන................ 06
ආර්ථික ................ 07
කාන්තා ................ 08
දැක්ම ................ 09
විශ්ලේෂණ................ 10
වේදිකාව................ 11


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# විදුලි බල මණ්ඩලය විකිණීමට එරෙහිව කොළඹදී සමුළුවක්




ආණ්ඩුව විසින් විදුලි බල මණ්ඩලය කොටස් 15 කට කඩා විකිණීමට එරෙහිව ලංකා විදුලි බල මණ්ඩලයේ සියලු වෘත්තීය සමිති එකතුවී දැවැන්ත සමුළුවක් කොළඹ විහාරමහා දේවී එළිමහන් රංග පීඨයේදී පවත්වනු ලැබීය. මේ සඳහා රට පුරා විදුලි සේවකයින් දහස් ගණනින් සහභාගී වූ අතර සියලු සේවකයින්ගේ ඒකමතිකත්වයෙන් සමුළු යෝජනා 03ක් මෙහිදී සම්මත කරගනු ලැබිණි. ලංකා විදුලි සේවක සංගමයේ ලේකම් රංජන් ජයලාල්, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ විදුලි බල මණ්ඩල ශාඛාවේ ලේකම් ප්‍රියන්ත ප්‍රභාත්, ජාතික සේවක සංගමයේ ලේකම් අජිත් දේවප්‍රිය, විදුලි ඉංජිනේරු සංගමයේ සභාපති නිහාල් වීරරත්න ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ විශාල පිරිසක් මේ සඳහා සහභාගි වී සිටියහ.

# ඔබේ මුදල් ඔබේ දරුවන්ට... වරාය සමුපකාරයෙන් දරුවන්ට ශිෂ්‍යත්ව



ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකුවේ සාමාජිකයන්ගේ 2022 වර්ෂයේ පහ වසර ශිෂ්‍යත්වය සමත් දූදරුවන් 270 දෙනෙකු සඳහා ශිෂ්‍යාධාර හා තිළිණ ප්‍රධානෝත්සවය පසුගිය 24 දින මහරගම ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන ශාලාවේදී 'ඔබේ මුදල් ඔබේ දරුවන්ට' යන තේමාව සහිතව පැවැත්විණි. මෙහි ප්‍රධාන ආරාධිතයින් ලෙස ජාතික ජන බලවේගය ජාතික විධායක සභික කැලණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය වසන්තා සුභසිංහ මහත්මිය, සමුපකාර සංවර්ධන කොමසාරිස් සමුපකාර සමිති රෙජිස්ටාර් ඩී ජීවනාදන් මහතා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන කළමණාකරු (පරිපාලන) නෙළුම් අනවරත්න මහත්මිය, සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ප්‍රධාන ලේකම් නිරෝෂන් ගොරකානගේ සහෝදරයා ඇතුළු පිරිසක් සහභාගි වූහ. මෙහිදී පිරිස ඇමතූ සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ලේකම් නිරෝෂන් ගොරකානගේ සහෝදරයා පැවසුවේ පසුගිය අවුරුද්දෙදී රුපියල් බිලියන 4.6 ක් වූ වත්කම් මේ අවුරුද්ද වන විට බිලියන 05 දක්වා වැඩිකරගැනීමට හැකිවූයේ අදූෂිත කණ්ඩායමකගේ කැපවීම නිසා බවය. එවැනි පිරිසක් නිර්මාණය වූයේ ජනතා විමුක්ති පෙරමුණේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ නායකත්වය නිසා බවද ඔහු වැඩිදුරටත් පෙන්වා දුන්නේය.

# ගෙවන වාට්ටු වැඩපිළිවෙළ පරදවන්න විරෝධතා රැසක්




පෞද්ගලික ගෙවන වාට්ටු වැඩපිළිවෙළ මගින් නිදහස් සෞඛ්‍ය සේවාව වලපල්ලට යවන ආණ්ඩුවේ ක්‍රියාමාර්ගයට එරෙහි වෘත්තීය සමිති නියෝජිත හමුවක් පසුගියදා මරදාන සමාජ හා සාමයික කේන්ද්‍රයේදී පැවැත්විණි. සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති එකමුතුව මගින් සංවිධානය කරන ලද මෙම නියෝජිත හමුව සඳහා සමස්ත ලංකා සෞඛ්‍ය වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති සමන්ත කෝරලේආරච්චි, සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමයේ ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර, සමස්ත ලංකා හෙද සංගමයේ ලේකම් එස්.බී. මැදිවත්ත, පරිපූරක වෛද්‍ය සේවා මධ්‍යස්ථානයේ ඖෂධවේදී චලිත් සමරදිවාකර, සමස්ත ලංකා සුවසේවා සංගමයේ ලේකම් මහින්ද ගුරුගේ, සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය නිලධාරී සංගමයේ ලේකම් වෛද්‍ය නිලන්ත බණ්ඩාර, සමස්ත ලංකා ඕවර්සියර් සංගමයේ සභාපති ගුණතිලක සොයිසා ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ සහභාගි වූහ. රට පුරා රෝහල් ආවරණය කරමින් විරෝධතා බැනර අත්සන් කිරීම, විරෝධතා පෙත්සම් අත්සන් තැබීමේ ක්‍රියාමාර්ග මේ වන විට දියත් කරමින් ඇති අතර වෛද්‍ය ජයන්ත බණ්ඩාර මෙහිදී පැවසුවේ ආණ්ඩුව විසින් සිදු කරන මෙම රෝහල් පෞද්ගලීකරණ වැඩපිළිවෙළ පරාජය කිරීමේ සටනට සියලු ජනතාවට ආරාධනා කරන බවතය.

# ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයෙන් රට පුරා දිස්ත්‍රික් සමුළු

විකිණීමට, EPF/ETF කොල්ලයට, ජීවන බරට, මර්දනයට, මැතිවරණ කල් දැමීමට, බදු බරට හා අසාධාරණ කම්කරු නීති සංශෝධනයට එරෙහිව ජන බලය ගොඩනගන ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ දිස්ත්‍රික් සමුළු පැවැත්වීම පසුගියදා ගම්පහදී ඇරඹිණි. ඒ, ගම්පහ සුමේධ විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදීය. මෙම සමුළුව ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මේ සඳහා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ලේකම් හා ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ සහ වෘත්තීය සමිති සාමාජිකයෝ රැසක් සහභාගි වූහ. මේ වන විට පොළොන්නරුව, මාතලේ දිස්ත්‍රික්වලදී ලාල්කාන්ත සහෝදරයාගේ හා අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් සමුළු පවත් වන ලද අතර ඉදිරියේ පුත්තලම, අනුරාධපුරය, ගාල්ල, මාතර ඇතුළු සියලු දිස්ත්‍රික්ක ආවරණය කරමින් මෙම සමුළු පැවැත්වීමට කටයුතු යොදා ඇති බව ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ උප ලේකම් චන්දන සූරියආරච්චි සහෝදරයා නියමුවා වෙත පැවසීය.

01 පිටුවෙන්...

# ආණ්ඩුවේ ඒකාධිපති ගමන පරාජය කරනවා




උත්සාහ කරන්නේ දැනට තිබෙන අවුරුදු හතරක ධුර කාලය විශේෂ තත්වයක් යටතේ මාස 12කින් දීර්ඝ කරන්න ඇමතිවරයාට දී තිබෙන බලතල සම්බන්ධවයි. තිබෙන පනත අනුව එසේ කළ හැකි උපරිම කාලය අවුරුදු 05යි. මේ කියන සංශෝධනය අනුව කාල සීමාවකින් තොරව දීර්ඝ කරන්නත් විසුරුණු පළාත් පාලන ආයතන නැවත කැඳවන්නත් තක්කඩි උත්සාහයක යෙදී ඉන්නවා.

කලින් නම්, ඇමතිවරයාට පළාත් පාලන ආයතනයක් කල්දැමිය හැක්කේ මාස 12යි. මේ පනතේ අඩුම ගණනේ කාලසීමාවක් වත් නැහැ. "අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් කාලසීමාවකට" කියලා දැක්වෙන්නේ. වුවමනානම්, මේ පනත සම්මත කරගෙන ජීවිත කාලයටම වුණත් ඇමතිවරයාගේ තීරණය අනුව කාලය කල්දමා ගන්න පුළුවන්. ඊටත් වඩා බරපතළ දේ විසුරුවා හැරි පළාත් පාලන ආයතන නැවත කැඳවීමේ බලයක් ඇමතිවරයාට දෙන්න සූදානම් වීමයි. 2018 පැවැත්වූ පළාත් පාලනවල නිල කාලය 2022 අවසන් වුණා. පනතට අනුව 2023 මාර්තු දක්වා අවුරුද්දකින් කල් දැමුවා. මේ නිසා මැතිවරණ නීතියට අනුව මැතිවරණ කොමිසමෙන් පළාත් පාලන මැතිවරණය ප්‍රකාශයට පත් කළා. නාමයෝජනා කැඳවූවා. දේශපාලන පක්ෂ නාමයෝජනා බාර දුන්නා. ඒත් රනිල් වික්‍රමසිංහ මුදල් වෙන් නොකර, මුද්‍රණාලයට බලපෑම් කර, ඡන්දය නොතියා විශේෂ කොමසාරිස්වරු යටතේ මේ ආයතන පවත්වාගෙන යනවා.

පොහොට්ටු පක්ෂයේ බිම් මට්ටමේ බලය පවත්වාගෙන ගියේ, පළාත් පාලන ආයතන යටතේ. ඒ නිසා රනිල් වික්‍රමසිංහලාට මහින්ද රාජපක්ෂලාට පරණ සභාපතිවරුන්ට සහ මන්ත්‍රීලාට නැවත පණ දෙන්න අවශ්‍ය වී තිබෙනවා. හිටපු සභාපතිලාට ආණ්ඩුකාර නියෝජිතයන් එක්ක ගැටගහලා නැවත පණ දෙන උත්සාහය පසුගිය කාලයේ තිබුණා. එයට මැතිවරණ කොමිසමත් රටේ ජනතාවත් විරෝධය පළ කළා. දැන් හදන්නේ මැරුණු, පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට, මන්ත්‍රීලාට නැවත පණ දෙන්නයි.

ජනතාව තමන්ගේ පරමාධිපත්‍යයේ බලය පවරන්නේ යම් නිශ්චිත කාලයකට. පළාත් පාලන ඇමති කියන තනි පුද්ගලයෙකුට ජනතා පරමාධිපත්‍ය බලය පවරන්න රනිල් වික්‍රමසිංහ තක්කඩි ලෙස උත්සාහ කරනවා. පුද්ගලික මන්ත්‍රී යෝජනාවක් වුණාට මෙතන තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට පටහැණි රනිල් වික්‍රමසිංහලාගේ, රාජපක්ෂලාගේ වුවමනාවක්. මේක අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් පටහැණියි. මීට පෙර නඩු තීන්දුවල සඳහන් කර තිබෙනවා අවශ්‍ය නම් ජනවරම කෙටි කළ හැකි වුණත් දීර්ඝ කරන්න බැහැ කියලා. ජනතාව විසින් ගත යුතු තීරණය මේ මගින් ඇමතිවරයාට දෙන්න යනවා.

මේක අතිශය බරපතළ පිළිකුල් සහගත, ප්‍රජාතන්ත්‍ර විරෝධී තක්කඩි වුවමනාවක් වෙනුවෙන් කරන වැඩක්. රනිල් වික්‍රමසිහංට මේවා පුරුදු නැති දේවල් නෙමෙයි. රනිල්ගේ මාමා ජේ.ආර්. ඉන්න කාලයේත් මේ වාගේ ගේම් ගසා තිබෙනවා. 1977 දී ලබාගත් 5/6ක බලය 1983 මහ මැතිවරණය නොතියා නැවත තියාගන්න 1982 දෙසැම්බර් මාසයේ ජනමත විචාරණයක් පවත්වා පාර්ලිමේන්තු කාලය අවුරුදු 06කින් කල්දමා ගත්තා. මේක ඉතාමත්ම නරක බරපතළ තත්වයක්. ජනතාවගේ ඡන්දය දීමේ අයිතිය විනාශ කර, එන්න යන්නේ මොකාටද කියලා අපට තේරෙනවා. ඊළඟ වාරයේ ජනාධිපති වෙන්න හීන දකින පසුගිය මැතිවරණයෙන් දිස්ත්‍රික්කයෙන් පවා පැරදුණු රනිල් වික්‍රමසිංහ දැන් රාජපක්ෂලා ලබාදුන් ජනාධිපතිකම අතේ තබාගෙන ඉන්නේ. පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල ඔහුගේ ජනාධිපති හීනවලට බලපානවා. මහින්ද රාජපක්ෂලාට පාර්ලිමේන්තුවේ තිබෙන ජනවරම මහ පොළොවේ නැති බවත්, රනිල් වික්‍රමසිංහට ජනවරමක් නැති බවත්, ඔප්පු වෙන නිසා, පළාත් පාලන මැතිවරණය නීති විරෝධීව කල්දමා තිබෙනවා.

ඔහුගේ ඊළඟ ජනාධිපති හීනයට පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵලය බාධාවක් වන නිසා, මැතිවරණය කල්දමලා අනිත් පැත්තෙන් පොහොට්ටුවේ උදව් ගන්න, ප්‍රාදේශීය සභාවල බලය නැවත ගොඩනඟන්නයි මේ සූදානම් වෙන්නේ. මේ පනත සම්මත කර ගන්න බැරි වුණත්, බිම්මට්ටමේ ඉන්න අයට යම් චිත්ත ධෛර්යයක් දෙන්න උත්සාහයක් මේ තුළින් කරනවා. ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම, ව්‍යවස්ථාව පැත්තකට දමලා, රනිල් වික්‍රමසිංහගේ ආරක්ෂාව සලකන රාජපක්ෂ කණ්ඩායමේ බල ව්‍යාපෘතිය ආරක්ෂා කරගන්න ව්‍යවස්ථාමය දහංගැට මේ විදිහට ගහනවා. පළාත් පාලන ආයතන කිහිපයක හරි මැතිවරණ පවත්වා බිමේ බලයක් තිබෙන බව ඔප්පු කරන්නැයි අපි අභියෝග කරනවා. සිහි බුද්ධිය තිබෙන කෙනෙකුට මේ වගේ අදහස් ඔළුවට එන්නේ නැහැ. කවුරු මගින් මේ සංශෝධනය ගේන්න උත්සාහ කළත් පිටිපස්සේ ඉන්නේ රනිල් වික්‍රමසිංහ සහ රාජපක්ෂවරු බව අපි දන්නවා. ජනතා විමුක්ති පෙරමුණ සහ ජාතික ජන බලවේගය හැටියට අපි මෙය පරාජය කිරීමට අධිකරණමය ක්‍රියාමාර්ග ඇතුළු සියලු ක්‍රියාමාර්ග ගන්නවා."

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# අවසන් දේපළත් විකිණීමෙන් පසු...

ලංකාවේ ණයට කෑමේ හා විකුණන් කෑමේ ආර්ථික ප්‍රතිපත්තිය මහා පරිමාණයෙන් ක්‍රියාත්මක වීම ඇරඹුණේ 1977න් පසුවය. ඒ, ජේ.ආර්. ජයවර්ධන හෙවත් රනිල්ගේ මාමා රටේ බලය ගැනීමෙන් පසුවය. අධිරාජ්‍යවාදී ආර්ථික දේශපාලන න්‍යාය පත්‍රයට මුළුමණින්ම යටත්ව සිටි ජයවර්ධන නව ලිබරල්වාදී ආර්ථික මොඩලය ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම ඇරඹුවේ රජයේ දේපළ ඊනියා පෞද්ගලීකරණයේ නාමයෙන් පෞද්ගලික අංශයට විකුණා දැමීම ආරම්භ කරමිනි.

ගෙවුණු කාලය තුළ ජයවර්ධන, ප්‍රේමදාස, චන්ද්‍රිකා, මහින්ද, රනිල් පාලනය තුළ රජයට අයත්ව තිබූ කර්මාන්ත, වතු ඇතුළු රාජ්‍ය ආයතන 80කට වැඩි ප්‍රමාණයක් විකුණා දමනු ලැබ ඇත. මේවා සමහරක් දැන් වසා දමා ඇත. එසේ වසා දමන ලද වටිනාම කර්මාන්ත අතර කන්තලේ සීනි කම්හල, අඹිලිපිටිය කඩදාසි කම්හල, ගිංතොට තුනී ලෑලි කම්හල, බටලන්ද යූරියා කම්හල හා නයිලෝන් කර්මාන්ත ශාලාවද වේ.

රජයේ සම්පත් විකිණීමේදී පාලකයින්ගේ තර්කය වූයේ පාඩු ලබන රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කළ යුතුය යන්නය. පෞද්ගලිකරණයේ මෙන්ම ජනතාකරණය යන නාමකරණ යටතේ මේවා තමන්ගේ ගජමිතුරන්ට කුණු කොල්ලයට විකුණා දමා තිබේ. ඉන් රටේ ආර්ථිකය බිඳ වැටුණා මිස ශක්තිමත් වූයේ නැත.

රාජ්‍ය සම්පත් විකිණීම නව ලිබරල්වාදී ආර්ථික මොඩලයේ පදනම තුළම තිබේ. එම ප්‍රතිපත්තිය නම් රජය ආර්ථිකයෙන් ඉවත්ව ආර්ථිකයට තරගකාරිත්වය තුළ නිදහසේ ගලා යාමට ඉඩ දිය යුතු බවය. ආර්ථිකය තුළ ඒකාධිකාරයක් තිබිය යුතු නැතැයි පවසන නව ලිබරල්වාදී චින්තනය ඒ නිසාම රාජ්‍ය ඒකාධිකාරයන්ද අහෝසි කර ආර්ථිකය 'නිදහස්' කළ යුතු බව පවසති.

ඔවුන්ගේ මනෝරාජික තර්කය වන්නේ ආර්ථිකයේ නිදහස් තරගය විසින් එය වර්ධනය වන බවත් තරගය නිසා ජනතාවට හොඳ සේවයක් ලැබෙන බවත්, තරගය නිසාම භාණ්ඩ හා සේවා මිලද අඩුවන බවත්ය. බැලූ බැල්මට මෙය සත්‍ය සේ පෙනුණද, එය ප්‍රායෝගිකව සත්‍ය නොවේ. සමහර ක්ෂේත්‍රවල පෞද්ගලික අංශයේ මැදිහත්වීම අවශ්‍ය වුවද අප වැනි ඌණ සංවර්ධිත රටවල ජනතාවගේ අත්‍යාවශ්‍ය සේවා සඳහා රජයේ මැදිහත්වීම අත්‍යාවශ්‍යය. එහෙත් ආණ්ඩුවල ප්‍රතිපත්තිය වී ඇත්තේ ආර්ථිකය අර්බුදයට ගොස් ආණ්ඩුවට මුදල් හිඟවූ විට රාජ්‍ය ආයතන කිහිපයක් විකුණාදමා කීයක් හරි හොයාගෙන එදාවේල ගතකිරීමය.

ලංකාවේ පෞද්ගලීකරණය මහජන සේවාවලට කර ඇති හානිය වටහා ගැනීමට පෞද්ගලික බස් සේවාව වුවද ප්‍රමාණවත්ය. මෙහි බරපතළ ප්‍රශ්නය වන්නේ පාලකයින්ගේ අසමත්කම, වංචා, දූෂණ, නාස්තිය නිසා රාජ්‍ය ආයතන දුර්වල වන විට ඒවා විකුණා දැමීම හොඳයයි සිතීමට ජනතාවද පෙළඹීමය.

දැන් ජේ.ආර්.ගේ බෑනා වන රනිල් වික්‍රමසිංහ, රාජපක්ෂ කල්ලිය විසින් ජනාධිපතිකමට පත්කර තිබේ. නව ලිබරල්වාදයේ අවසන් ඉනිම ක්‍රීඩා කර තම කාර්යය අවසන් කිරීමට රනිල් වික්‍රමසිංහ කටයුතු කරමින් සිටියි. ඒ අනුව ඔහු රටේ ජාතික ආරක්ෂාවට පවා බලපාන තෙල්, විදුලිය වැනි සම්පත් කෑලි කඩා විකුණා දැමීමේ සැලැස්ම ක්‍රියාවට නගමින් සිටියි.

ඒ අනුව විදුලිබල මණ්ඩලය සමාගම් 15කට කඩා, පෞද්ගලික අංශයට පැවරීමට නියමිතය. එසේම තෙල් සංස්ථාව සතු ඉන්ධන පිරවුම් පොළවල් 450ක් ඕස්ට්‍රේලියා, චීන හා එක්සත් ජනපද සමාගම්වලට එක් සමාගමකට 150 ගණනේ ලබාදීමට කටයුතු කරමින් සිටී. මෙහි පළමු තෙල් පිරවුම්පළවල් 150 මෑතදී චීනයේ සිනෝපැක් සමාගමට ලබා දෙන ලදී.

මීට අමතරව රජයේ ඉඩම්, ගොඩනැගිලි ඇතුළු සම්පත් රැසක්ම විකුණා දැමීමට නියමිතය. මේ පිළිබඳව වරක් ජනාධිපතිවරයා ප්‍රකාශ කළේ රටට මුදල් නැති නම් මුදල් සෙවීමට මේවා විකිණිය යුතු බවය. දැන් ප්‍රශ්නය වන්නේ අවසාන සම්පතත් විකුණාගෙන කෑ පසු යළි විකුණන්නේ මොනවාද කියාය.

පාලකයින් තමන් බලයේ සිටින කාලයේ වසර කිහිපයක් සුරසැප විඳ ඉන්පසු යා හැක. ඊතාක් රටට, ජනතාවට, අනාගත පරපුරට රටේ සම්පත් ඉතිරිවී තිබිය යුතුය. මේ බොරු තර්ක පෙන්වා කරන අපරාධය නැවැත්විය යුත්තේ ඒ නිසාය. නිෂ්පාදන සේවා ආයතන රජය සතුව තිබිය යුතු නැතැයි පවසා ඒවා විකුණන විට එම ආයතන මිලට ගන්නේ චීනයේ රාජ්‍ය සමාගමක්ය. (සිනොපැක්) ලංකා අයි.ඕ.සී.ද ඉන්දියාවේ රාජ්‍ය සමාගමකි. ඒ අනුව රනිල්ලාගේ බොරුව හා වංචාව හෙළි වේ.

මීට අමතරව දැන් සෞඛ්‍ය හා අධ්‍යාපන සේවාවන්ද ආණ්ඩුව හිතා මතාම විනාශ කරමින් සිටියි. එහි අවසන් ප්‍රතිඵලය ඉතා පැහැදිලිය. එනම් අධ්‍යාපන හා සෞඛ්‍ය සේවයේ ඉතිරි ටිකද පෞද්ගලීකරණය කර ආණ්ඩුව 'අත පිසදමා ගන්නවා' ඇත.

රට ගොඩ නැගීමට අසමත් පරගැති පාලකයින් විසින් තම පැවැත්ම වෙනුවෙන් එදාවේල සොයා ගැනීමට කරන රටේ වටිනාම සම්පත් විකුණා දැමීමේ මේ අපරාධය වහා නැවැත්විය යුතුය. එය නතර කිරීමට රනිල්ලා සූදානම් නොවන තත්වයක් තුළ මෙම දුෂ්ට පාලක කල්ලියම පරදා රට සැබෑ ලෙසම රැක ගැනීමට සියලු දෙනා පෙරට ආ යුතුය. එය මෙරට සැබෑ දේශප්‍රේමී, අධිරාජ්‍ය විරෝධී බලවේගයන්ගේ වගකීම බවද අවධාරණය කළ යුතුය.

# ආර්ථිකය කඩා වැටීම හා මහදැනමුත්තාගේ විසඳුම්

රනිල් වික්‍රමසිංහ ජනාධිපති ධුරයට පත්කරගනු ලැබුවේ රට බරපතළ ආර්ථික කඩා වැටීමක තිබියෙදී පාර්ලිමේන්තුවේ රාජපක්ෂ කල්ලියේ වුවමනාවටය. දැන් එලෙසින් ජනවරමකින් තොරව ජනාධිපති වූ රනිල්, රාජපක්ෂවරුන්ගේද සම්පූර්ණ සහයෝගය සහිතව රට අධිරාජ්‍යවාදී ආර්ථික උපායමාර්ගයේ අවසානය දක්වාම ගෙන යාමට පටන්ගෙන තිබේ.

පසුගිය කාලයේ පැවති ආර්ථික අර්බුදයේ හේතු, ගැඹුරින් විමසා ඊට සැබෑ පිළියම් යොදවනවා වෙනුවට රනිල් කළේ අයි.එම්.එෆ්. සරණ යාමය. පවතින බරපතළ ආර්ථික කඩා වැටීමෙන් රටත් ජනතාවත් මුදා ගැනීම සඳහා යැයි කියමින් දැන් අයි.එම්.එෆ්. නියෝග අනුව රනිල් ගන්නා ක්‍රියාමාර්ග "මහදැනමුත්තාගේ වැඩ" බවට පත්ව තිබේ. එළුවාගේ ඔළුව මුට්ටියේ හිරවූ විට, ගෙදර තාප්පයක් කඩා, එළුවාගේ බෙල්ලත් කපා, මුට්ටියත් බිඳ දැමූ මහදැනමුත්තාගේ "විසඳුම්" වර්ගයේ විසඳුම් දැන් රනිල් අපේ රට තුළද සිදුකරමින් සිටියි.

රනිල් ඇතුළු පාලක නඩය මුලදී ජනතාවට කීවේ ණය අර්බුදයෙන් ගොඩ ඒම සඳහා, විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා හා අලුතින් ණයක් ගැනීම සඳහා ඇති එකම මඟ අයි.එම්.එෆ්. යාම පමණක් බවය. මූල්‍ය අරමුදල සමග එකඟතාවයට ආවේ ඒ අනුවය. එහෙත් දැන් සිදුකරමින් පවතින්නේ කුමක්ද?

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟතාවන් ඇතිකර ගැනීමෙන් පසු තවමත් ලංකාවට මූල්‍ය අරමුදලින් ලැබී ඇත්තේ ඩොලර් මිලියන 330ක ණයක් පමණි. එය සොච්චම් ප්‍රමාණයකි. වසර හතරකටම ලැබෙන්නේ ඩොලර් බිලියන 2.9කි. ණයවල ඊළඟ වාරිකය ලැබෙන්නේ ඊට පසුව ඉටුකළ යුතු කොන්දේසි සම්පූර්ණ කිරීමත් සමගය.

අයි.එම්.එෆ්. වැඩසටහනේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ප්‍රධානම අවශ්‍යතාවය වී තිබෙන්නේ, විදේශ ණය ප්‍රමාණයක් කපා හැර ගැනීම හා ගෙවීම් පමාකර ගැනීමය. එහෙත් දැන් සිදුවී තිබෙන්නේ කුමක්ද? විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර, දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමය. ආණ්ඩු දේශීය ණය ලබාගෙන ඇත්තේ රාජ්‍ය බැංකුවලින් හා ඊ.පී.එෆ්. සහ ඊ.ටී.එෆ්. අරමුදල්වලිනි. ඒවා ජනතාවගේ තැන්පතු හා පෞද්ගලික අංශයේ සේවකයන්ට අයිති මුදල්ය. ඒවා "ප්‍රතිව්‍යුහගත" කරන විට කැපී යන්නේත්, කල්දමන්නේත් ජනතාවට අයත් මුදල්ය; නැතිව රනිල්ගේ හෝ රාජපක්ෂලාගේ මුදල් නොවේ.

රාජපක්ෂලා, රනිල්ලා, වසර ගණනාවක් තිස්සේ කළ ආර්ථික, ව්‍යසනයට අවසානයේ වන්දි ගෙවීමට




සිදුව ඇත්තේ ජනතාවටය. මෙය ලංකාවේ බැංකු පද්ධතියේ පැවැත්මටද තර්ජනයකි. බැංකුවල ස්ථාවරත්වය පිළිබඳ ජනතාව තුළ සැක උපදවන්නකි. අති විශාල කාලයක් වූ දින පහක් එක දිගටම බැංකු වසා තැබීම නිසා, මේ සැකය තවත් වැඩි වී තිබේ. එවැනි තත්වයක් තුළ තැන්පත්කරුවන් බැංකුවලින් තම තැන්පතු ඉවත්කර ගැනීමට එකවර උත්සාහ කළහොත් බැංකු පද්ධතිය බරපතළ අවදානමකට ලක්වනු ඇත. ඉන් සිදුවන්නේ එක් අර්බුදයක් විසඳීමට ගොස් ඊට වඩා බරපතළ අර්බුද කැඳවා ගැනීමය. මෙය පැහැදිලිවම මහදැනමුත්තාගේ වර්ගයේ "විසඳුමකි".

මේ අතර දැන් සමෘද්ධිලාභීහුද කලබල වී සිටිති. ඒ අලුත් "අස්වැසුම" නම් වැඩසටහන තුළ බොහෝ දිළිඳු අය මඟහැර හෝ ඉවත් කර තිබීමය. එක් පැත්තකින් දිළිඳුකම වැඩිකරන ආණ්ඩුව අනෙක් පැත්තෙන් සහන ලබාදෙන දිළිඳු පවුල් ප්‍රමාණය අඩුකරමින් සිටී. පසුගිය දිනෙක ඉරිදා ජාතික පුවත්පතක් වාර්තා කර තිබුණේ "හරි හමන් කෑම වේලක් නැති ජනයා ලක්ෂ 75ක්" සිටින බවය. එලෙස වේලක් කෑමට නොහැකි දිළිඳු ජනයාගේ ප්‍රමාණය වැඩිවෙද්දී අස්වැසුම ප්‍රතිලාභ ලබාදෙන පවුල් ප්‍රමාණය අඩු කිරීමද, මහදැනමුත්තා වර්ගයේම ක්‍රියාවකි. මෙහි හාස්‍යජනකම කරුණ වන්නේ රනිල්ගේ මෙම යෝජනාවලට ඇමති මණ්ඩලයේදී අනුමැතිය දෙන, පාර්ලිමේන්තුවේදී අත ඔසවන, පොහොට්ටු මන්ත්‍රීවරුම එළියේදී මේ සඳහා බොරු විරෝධයක් පළ කරමින්, කිඹුල් කඳුළු සැලීමය.

මූල්‍ය අරමුදලේ යෝජනාවට අනුව එලෙසින් රාජ්‍ය වියදම් අඩුකරමින් සිටින ආණ්ඩුව අනෙක් අතින් රාජ්‍ය ආදායම් වැඩිකර ගැනීම සඳහා ගත් පියවර වූයේ බදු වැඩි කිරීමය. ඒ අතර, උපයන විට ගෙවීම් බද්ද විශේෂ එකක් විය. භාණ්ඩ හා සේවා මත අධික ලෙස බදු පැටවී, බඩුමිල වැඩිවන විට සිදුවන්නේ ජනතාව භාණ්ඩ මිලදී ගැනීම සීමා කිරීමය. එවිට ආණ්ඩුවට ලැබෙන බදු ප්‍රමාණයද අඩුවේ. උපයන විට ගෙවීමේ බද්දට විරෝධය පළ කළ මසකට රුපියල් ලක්ෂය ඉක්මවූ වැටුප් ගන්නා වෘත්තිකයෝ අවසානයේ රට හැරයාම ඇරඹූහ. එහි ප්‍රතිඵලය වන්නේද, රජය අපේක්ෂා කළ බදු ආදායම අඩු වීමය. අවසානයේ අපේක්ෂිත බදු ප්‍රමාණය රජයට නොලැබෙන අතර, අත්‍යවශ්‍ය වෛද්‍ය, ඉන්ජිනේරු, විශ්වවිද්‍යාල ආචාර්යවරු වැනි වෘත්තිකයන්ගේ සේවාවද, රටට අහිමි වේ. එය බදුත් නොලැබී මානව සම්පතත් අහිමි වීමේ ඛේදවාචකයකි.

> රනිල් වික්‍රමසිංහලාට, මහින්ද රාජපක්ෂලාට මේ රට හැදීමේ හෝ මේ අර්බුදයෙන් රට ගොඩගැනීමේ සැබෑ වුවමනාවක් හෝ හැකියාවක් නැත. ඔවුනට අවශ්‍ය තව ටික කලක් හෝ බලයේ සිටීම සඳහා ආණ්ඩුවේ ගිණුම් තුලනය කර ගැනීමය. තවත් ණය ටිකක් කෙසේ හෝ ලබා ගැනීමය. තවත් ටික කාලයක් බලයේ සිටීම වෙනුවෙන් තවත් ණය වෙනුවෙන් ඕනෑම දෙයක් පාවාදීමට ඔවුන් සූදානම්ය.

මෙයට හොඳ උදාහරණය වන්නේ ආණ්ඩුවේම මහ බැංකුවේ සංඛ්‍යාවන්ය. 2023 වසර සඳහා ආණ්ඩුවේ අපේක්ෂිත බදු ආදායම රුපියල් බිලියන 3100කි. එහෙත් 2023 පළමු කාර්තුව තුළ ලැබිය යුතු බදු ආදායම් ආණ්ඩුවට ලැබී ඇත්තේ 40%ක ප්‍රමාණයක් බව පැවසේ. ඉදින් දැන් ආණ්ඩුව ගන්නා ආර්ථික ක්‍රියාමාර්ග මහදැනමුත්තාගේ ක්‍රියාමාර්ග හා සමාන නොවේද?

රනිල් වික්‍රමසිංහලාට, මහින්ද රාජපක්ෂලාට මේ රට හැදීමේ හෝ මේ අර්බුදයෙන් රට ගොඩගැනීමේ සැබෑ වුවමනාවක් හෝ හැකියාවක් නැත. ඔවුනට අවශ්‍ය තව ටික කලක් හෝ බලයේ සිටීම සඳහා ආණ්ඩුවේ ගිණුම් තුලනය කර ගැනීමය. තවත් ණය ටිකක් කෙසේ හෝ ලබා ගැනීමය. තවත් ටික කාලයක් බලයේ සිටීම වෙනුවෙන් තවත් ණය වෙනුවෙන් ඕනෑම දෙයක් පාවාදීමට ඔවුන් සූදානම්ය. මේ අප දකිමින් සිටින්නේ එයය.

මූල්‍ය අරමුදලේ ණයක් වෙනුවෙන් බැංකු අනතුරට දැමීමට, ජනතාවගේ සේවක අර්ථසාධක අරමුදල් කප්පාදු කිරීමට ඔවුන් සූදානම්ය. තෙල්, විදුලිය ඇතුළු වටිනාම රාජ්‍ය ආයතන විදේශ සමාගම්වලට කෑලි කෑලි කඩා විකුණා දැමීමට ඔවුන් සූදානම්ය. දිළිඳු ජනතාවගේ සහන පවා කප්පාදු කිරීමටත් ජනතාව මත තව තවත් බර පැටවීමටත් ඔවුන් සූදානම්ය. එබැවින් රනිල් - රාජපක්ෂ පාලනයේ මෙම ගමන රට විනාශ කරමින් යන ගමනක්ය.

ඒ සියල්ල එසේ වෙද්දී මෙම මහදැනමුත්තාගේ ක්‍රියාමාර්ගවලින් පීඩාවට පත්වෙන සමස්ත ජනතාවම මෙම පාලකයන්ට එරෙහිවම යළි නැගී සිටිනු ඇත. මෙම පාලනය පෙරළා දැමීමට කටයුතු කරනු ඇත. දැනටමත් බහුතරයක් ජනයා ඒ සඳහා ජාතික ජන බලවේගය තෝරාගෙන තිබේ. ඒ අනුව අවසාන ලෙස කිව හැක්කේ රනිල් රාජපක්ෂ නඩය මේ කෙළිමින් සිටින්නේ වේගයෙන් රත්වෙමින් තිබෙන දිය සැළියක බවය.



# YES WE CAN

# බත් පතටම තට්ටු කරන IMF යෝජනා

අයි.එම්.එෆ්. ණය ලංකාවට ලබාදීමේදී ඇති කරගත් එකඟතාවයන් අතර රජයේ වියදම් කප්පදු කිරීම හා රජයේ ආදයම් ඉහළට ගැනීම මූලික එකඟතාවයකි. ඒ අනුව රජයේ ආදායම් වැඩි කරගැනීම වෙනුවෙන් ආණ්ඩුව නව බදු ක්‍රම හඳුන්වා දුන්නේ සාමාන්‍ය ජනතාවට තබා වෘත්තිකයින්ට පවා දරාගත නොහැකි ලෙසය. එය සෘජු හා වක්‍ර ලෙස ඇති කළ බලපෑම කෙසේද යත්, ලංකාවේ ජනගහනයෙන් 68%කට අද දෙවේල පිරිමසා ගැනීමට නොහැකි තත්වයක් උදාවී ඇත.

ඒ අතරතුර බැංකු පොලී අනුපාතද ඉහළ දමා ඇත්තේ රාජ්‍ය සේවයේ නියතු ජනතාව හා ණය ලබාගත් සියලු දෙනාට වත්මන් ආර්ථික අර්බුදය හමුවේ, ඉහළ යන ජීවන වියදම් හමුවේ, සිය ආදායම් හෝ වැටුප් සතයකින්වත් ඉහළ නොයන තත්වයක් තුළයි. රාජ්‍ය සේවකයෙකුගේ මාසික වැටුප, වියදමට කිසිදු අයුරකින් ගළපා ගැනීමට නොහැකි වීමේ මේ බේදවාචකය හමුවේ ඔවුන්ගේ බත්පත කප්පාදු වීම අරුමයක් නොවේ.

දැන් ආණ්ඩුවේ වියදම් අඩුකරගැනීමට ජනතාවට ලබාදෙන සමාජ රක්ෂණ අරමුදල් කොල්ලයට අතගසා ඇත්තේ "අස්වැසුම" මගිනි. සමෘද්ධි ප්‍රතිලාභීන් ලක්ෂ 23ක්, මාස නවයක් තුළ ලක්ෂ 12කට කප්පාදු කර, අතිශය අමානුෂික ලෙස වසර තුනක් තුළදී සියලුම ප්‍රතිලාභ කප්පාදු කර ආණ්ඩුව අතපිසදා ගැනීමට සැරසෙන්නේ දුප්පත්කම ලක්ෂ 30 සිට ලක්ෂ 75 දක්වා වැඩි වී ඇති ආර්ථිකය වටපිටාවක් තුළයි.

එසේම ආණ්ඩුව සිය ණය බර අඩු කරගැනීමට දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය මුවාවෙන් සැරසෙන්නේ පුද්ගලික අංශයේ රැකියාවල නිරත සේවකයින්ගේ අර්ථසාධක අරමුදල කොල්ලකෑමටය. පුද්ගලික අංශයේ රැකියා ලක්ෂ පහකට වැඩි ප්‍රමාණයක් අහිමි වී ඇති තත්වයක් තුළ, ජීවත් වීමට හෝ එදා වේල සරිකර ගැනීමට නොහැකි ලෙස අසරණ වී ඇති පුද්ගලික අංශ සේවකයින්ගේ අනාගත රැකවරණයට ඇති අර්ථසාධක අරමුදලද මෙලෙස කොල්ලකෑමට සැරසෙන්නේ, වර්තමානයේදී මෙනම අනාගතයේදීත් ඔවුන්ව අන්ත අසරණ වීමට ඉඩසලසමිනි.

මෙසේ අයි.එම්.එෆ්. පොරොන්දු ඉටුකිරීමට, පාලකයින්ගේ නොහැකියාව වසාගැනීම වෙනුවෙන් ඉතිහාසයේ මෙන්ම අදද සිදුකරන්නේ ජනතාවගේ බත්පතට තට්ටු කිරීමය, සියලු බර ජනතාවගේ කර මත පැටවීමය. ඒ මතින් සිය බලය රැකගෙන රටද, රටේ සම්පත්ද කුණුකොල්ලයට විකුණා දැමීම පමණය.

# ප්‍රේමයට ගිනි නොතියව්

ගිනි බින්ද ඉතිහාසෙ
පොත් අතර දැවී
බාගයක් පිළිස්සූ
ජාතියේ ඉරණමට
අප වින්ද දුක්බරම
ජීවිතේ කතාවකි
ජූලිය...
හදවත් දෙකක
වෛරය අවුළුවා
උන් කැමති ප්‍රේමයට
පමණක්ම ඉඩ තැබූ
අපි කැමති ප්‍රේමයට
වින කෙරූ යුද්ධයක
සාහසික මහඅත්
ලේ වත්කළ ජූලිය..
අමතක කළත් උන්
පාස්කුව දා වුණෙත්
ඉතිහාස මතක පොත
ගිනි තැබූ ප්‍රේමයක
ගිනිපුළිඟු පුපුරා
නැවත නැවතත්
ජූලිය...
යළි කිසි දිනෙක
නොදැවෙන්න දාහයෙන්
අදිටනම වපුරමු,
උන්ගේ වෛරයෙන්
"ජාතියේ ප්‍රේමයට"
නොඑන්නට කළු ජූලිය...

# මැයි 09 ප්‍රහාරයේ මානව හිමිකම් විමර්ශන ඇරඹේ




පසුගිය වසරේ මැයි මස 09වැනි දින ගෝල්ෆේස් අරගලකරුවන්ට, අරලියගහ මන්දිරයේ සිට පැමිණි මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ මැර පිරිස් විසින් නින්දිත ලෙස පහරදීම සම්බන්ධව මූලික මිනිස් අයිතිවාසිකම් කඩකිරීම සම්බන්ධ මානව හිමිකම් පැමිණිල්ල පසුගිය ජූනි 21දා විභාග යට ගන්නා ලදී. මෙම පෙත්සම ගොනු කරනු ලැබ තිබුණේ සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා විසිනි.

එහි දී කොල්ලුපිටිය පොලිසිය විසින් ලබා දී ඇති වාර්තාවේන්, එම ප්‍රහාරය වළක්වා ගැනීමට අසමත් වූ බව පිළිගෙන ඇති බව සඳහන් කර ඇත. මේ සඳහා කොල්ලුපිටිය පොලිසිය, පොලිස් මූලස්ථානය හා ප්‍රහාරයින් සමග පැමිණි බස්නාහිර පළාත් නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු වගඋත්තරකරුවන් ලෙස නම් කර තිබූ අතර පොලිස් මූලස්ථානය පමණක් එම අවස්ථාවට පැමිණ සිටියේය.

පැමිණිල්ල වෙනුවෙන් මෙම අවස්ථාවට නීතිඥ සුනිල් වටගල සහෝදරයා, එරංග ගුණසේකර සහෝදරයා ඇතුළු පිරිසක් සහභාගි වූහ. විමර්ශන කටයුතු ඉදිරියට පවත්වාගෙන යනු ලබන අතර රනිල් රාජපක්ෂ ආණ්ඩුව විසින් කරනු ලබන බලපෑම්වලට යටත් නොවී ස්වාධීන විමර්ශනයක් කර සාධනීය පිළිතුරක් දෙන ලෙස පෙත්සම්කරුවෝ කොමිසමෙන් ඉල්ලා සිටියහ.

# පරිසරවේදීහු එක තැනකට එක්වෙති




පරිසරවේදීන්, පරිසර සංවිධාන හා සිවිල් සංවිධාන එක්ව හමුවක් සමාජවාදී තරුණ සංගමය මූලිකත්වයෙන් පසුගිය ජූනි 28 වන දින බොරැල්ල එන්.එම්. පෙරේරා මධ්‍යස්ථානයේදී පැවැත් විණි. දැනට රට තුළ පරිසර ගැටලු විශාල ප්‍රමාණයක් මතුව ඇති අතර, ඉන් බහුතරයක් දේශපාලනයින්ගේ බලපෑමත්, ඔවුන්ගේ පුද්ගලික අවශ්‍යතාවය වෙනුවෙනුත් සිදු වන බව මෙහිදී අනාවරණය විය. වසර 75 ක් තිස්සේ මාරුවෙන් මාරුවට මෙම විනාශයන් සිදු වූ බවටත් ඒවා දිගින් දිගටම සිදුවන බවටත් අදහස් පළ විය.

මේ තත්වය තුළ පරිසරවේදීන් ලෙසත් දේශපාලන ක්‍රියාකාරි සංවිධානයක් වන සමාජවාදී තරුණ සංගමය ලෙසත් ඉදිරියේදී පරිසර විනාශයට එරෙහිව එක්ව අත්වැල් බැඳගනිමින් කටයුතු කිරීමට මෙම හමුවේදී යෝජනා විය. එම සාකච්ඡාවෙන් පසු මාධ්‍ය හමුවක් පවත් වන ලද අතර එහිදී පරිසරවේදී, ආචාර්ය රවින්ද්‍ර කාරියවසම්, සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර, පරිසරවේදී චමින්ද ජයසූරිය, රංගන ශිල්පී ජනක රණසිංහ ඇතුළු පිරිසක් අදහස් දැක්වූහ.

# තරුණ සංගමයෙන් දෙමසක මෙහෙයුමක්...



සමාජවාදී තරුණ සංගමය විසින් තරුණයන් ගොඩනැගීම හා අලුත් තරුණයන් එක්කගැනීමේ අරමුණෙන් ජූනි - ජූලි මාස දෙක තුළ රට පුරා මෙහෙයුමක් දියත් කර ඇත. මෙම වැඩපිළිවෙළ ශදමචය කකමඉල ශදමචය ·හල ශදමචය ක්පච ආදී වැඩසටහන්වලින් යුක්ත වේ. දැනට අරඹා ඇති මෙම වැඩසටහන් ඉතා සාර්ථක මට්ටමින් දියත් වෙමින් පවතින අතර මේ සඳහා විශාල තරුණ පිරිසක් සම්බන්ධ වෙමින් සිටිති. මේ වන විට ගම්පහ, කොළඹ, හම්බන්තොට, රත්නපුර, කුරුණගල, හම්බන්තොට වැනි දිස්ත්‍රික්වල මෙම වැඩසටහන් ආරම්භ කරනු ලැබ ඇත.

# "බෙදන්නට ඉඩ නොදෙමු! එක්ව අපි පියාඹමු..."




2008 සිට මේ දක්වා පැවෙත එන "සහෝදරත්වයේ දිනය" මෙවර "බෙදන්නට ඉඩ නොදෙමු! එක්ව අපි පියාඹමු.." යන තේමාවෙන් යුතුව පැවැත්වීමට සමාජවාදී තරුණ සංගමය සූදානම් වෙමින් සිටී. කළු ජූලිය වෙනුවට එම දිනය 'සහෝදරත්වය දිනය' ලෙස 2008 දී ප්‍රකාශයට ලක් කරමින් එදා මෙදා කාලය තුළ සිංහල, දෙමළ, මුස්ලිම් ජාතිකත්වයන් අතර එකමුතුකම, සහෝදරත්වය හා ජාතික සමගිය ගොඩනැගීම වෙනුවෙන් සමාජවාදී තරුණ සංගමය විවිධ වැඩසටහන් පවත්වමින් සිටියි.

මෙවරද දිස්ත්‍රික්ක කිහිපයක් තෝරාගනිමින් වැඩසටහන් රාශියක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. කොළඹ, මාතලේ, වවුනියා, යාපනය, ත්‍රිකුණාමලය, මඩකලපුව ආදී දිස්ත්‍රික්කවල වැඩසටහන් සූදානම් කර තිබේ. ජාතික සමගිය ගොඩනැගීම අරමුණු කරගනිමින්, නිර්මාණශීලී පෙළපාලි, අත්පත්‍රිකා බෙදාහැරීම, සංස්කෘතික වැඩසටහන්, ගම්මානවල මූලික කරගනිමින් සහෝදරත්වය වර්ධනය වන වැඩසටහන් හා යාපනය මුල් කර ගනිනමින් දෙමළ බසට පරිවර්තිත පොතක් එළිදැක්වීම ආදී වැඩසටහන් රාශියකින් යුක්ත වේ. මෙහි ප්‍රධාන වැඩසටහන ජූලි 23වැනි දින කොළඹ විහාරමහදේවී උද්‍යානයේදී පැවැත්වෙනු ඇත.

## ලෝකයෙන් සීඝ්‍රව ක්ෂය වී යන සත්ව ගහනය



එක්සත් රාජධානියේ බෙල්ෆාස්ට්හි ක්වීන්ස් විශ්වවිද්‍යාලය විසින් සිදුකරන ලද පර්යේෂණයකට අනුව ලොව වෙසෙන සත්ව විශේෂ අතරින් අඩකට ආසන්න සංඛ්‍යාවක් වඳ වීමේ තර්ජනයට ලක්ව ඇති බව සොයාගෙන ඇත.

මෙය IUCN රතු දත්ත ලැයිස්තුව මගින් සිදුකරන අධ්‍යයනයට වඩා වැඩි වශයෙන් සතුන් වඳ වීමේ තර්ජනයට ලක්ව ඇති බව අනාවරණය වී ඇත. IUCN රතු දත්ත ලැයිස්තුවේ සඳහන් තර්ජනයට ලක්ව නොමැති බවට සඳහන් කර ඇති සත්වයින් අතරින් 33%කගේ ගහනය අඩු වී ඇති බව මෙමගින් හෙළි වී ඇත. මෙම දැවැන්ත වඳ වී යාම සඳහා මූලිකම හේතුව මානව ක්‍රියාකාරකම් යැයි මෙම පර්යේෂකයෝ පවසති.

## හිඟන සංචාරකයන්ගේ සංක්‍රමණයේ වැඩිවීමක්!




ආසියානු කලාපයේ රාජ්‍යවලට හිසරදයක් වී ඇති begpackers හෙවත් හිඟන සංචාරකයන්ගේ ඉහළ යාමක් වාර්තා වී අතැයි වාර්තා වේ.

මෙය covid 19 වසංගතයෙන් පසු ආසියානු කලාපීය රටවල්වල දේශ සීමා විවෘත කිරීමත් සමග යුරෝපීය සංචාරකයන් මෙම හිඟන සංචාරකයන් ලෙස පැමිණෙන බව සඳහන් වේ.

මෙම සංචාරකයන් පිළිබඳව පර්යේෂණ කළ විවිධ විද්වතුන්ගේ අදහස් අනුව තමන්ගේ සංචාරය නිමා කිරීම සඳහා මෙවැනි හිඟන ක්‍රියාකාරකම්වල යෙදෙන බව ඔවුන් පවසා ඇත. ඒ අනුව ප්‍රසිද්ධ ස්ථානවල මුදල් ඉල්ලීමෙන් වැළකී සමාජ මාධ්‍ය ගිණුම් ඔස්සේ මුදල් සොයා ගැනීමේ ප්‍රවණතාවයක් ඇති බවද ඔවුහු ප්‍රකාශ කරති.

කෙසේ වෙතත් ධනවාදී සමාජ ක්‍රමය විසින් ඇති කරන ලද මෙම අර්බුදය ආසියානු කලාපීය රාජ්‍යවලට දැඩි පීඩාවක් වනු ඇතැයිද වාර්තා වී ඇත.

## පෘථිවියට සමාන තවත් ග්‍රහ ලොවක්



නාසා ආයතනය විසින් නාසාහි ජේම්ස් වෙබ් දුරේක්ෂය භාවිතා කරමින් පෘථිවියට සමාන තවත් ග්‍රහ ලෝකයක් සොයා ගැනීමට සමත් වී ඇත.

පෘථිවියේ සිට ආලෝක වර්ෂ හතළිස් එකක් ඈතින් පිහිටන මෙම ග්‍රහයා LHS 475 b ලෙස නම් කර ඇති අතර මෙහි වායුගෝලීය සැකැස්ම තවමත් අපැහැදිලිය. නමුත් ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික භෞතික විද්‍යාගාරයේ ආචාර්ය Jacob Lustig- Yaeger පවසන්නේ වායුගෝලයන් කිහිපයක් මෙම ග්‍රහ ලෝකය සතු බවයි. මෙම පාෂාණමය ග්‍රහලෝකය පෘථිවි විෂ්කම්භයට වඩා 01% කින් අඩුය. මෙහි ජීවයක් පවතින්නේද යන්න මෙතෙක් නිශ්චිතවම හෙළි කර නොමැත.

# මේ පාලකයන් මුළු සෞඛ්‍ය සේවාවම

# ස්වභාවික මරණයකට පත්වෙන්න ඉඩහැරලා

***නියමුවාඃ- දේශීය ණය කපා හැරීමට දවස් 05ක්ම බැංකු වසා දැමුවා. සති අන්තයේ පාර්ලිමේන්තුව කැඳවූවා. අනික් පැත්තෙන් අස්වැසුම තුළින් සමෘද්ධිය කැපුණු ජනතාව රට පුරා උද්ඝෝෂණ කළා. මේ අතර ජාතික ජන බලවේගය අධ්‍යාපනය සහ සෞඛ්‍යය කඩාවැටීම පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැත්වීම ජනතාවට දුරස්ථ නැද්ද?***

***වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයාඃ-*** ආණ්ඩුවේ මේ තීන්දු තීරණ සියල්ලම ජනතාවගේ ප්‍රශ්න තේරුම් නොගෙන, එක පුද්ගලයෙකුගේ අවශ්‍යතාවය මත ක්‍රියාත්මක කරන බව පැහැදිලියි. අයි.එම්.එෆ්. එකේ උපදෙස් වට්ටෝරුව ක්‍රියාත්මක කරමින් ජනතාවගේ දරිද්‍රතාවය වැඩිකරමින් තිබෙනවා. ජනතා ප්‍රශ්නවලට යම්කිසි විදිහකට රැකවරණ ලබාදුන් සමාජ ආරක්ෂණ ක්‍රමයත් ක්‍රමානුකූලව නැතිකරමින් යනවා. මේ වගේ එදිනෙදා ඇති වන තත්වයන් ගැන මහජනතාවගේ මූලික අවධානය තිබියෙදී, අධ්‍යාපනය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රවල ඉතාම බරපතළ දැවෙන ප්‍රශ්න යටපත් වෙනවා. මානව සම්පත රැකගැනීමේ ප්‍රධාන ක්ෂේත්‍ර දෙක තමයි සෞඛ්‍යය සහ අධ්‍යාපනය. ආණ්ඩුවේ ප්‍රධාන වගකීම ජනතාව රැකගැනීම නම් පාලකයන් මේ ක්ෂේත්‍ර දෙක කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කළ යුතු වෙනවා. නමුත් අද වන විට මේ ක්ෂේත්‍ර දෙකම බරපතළ අවදානමක තිබෙන්නේ.

ජනතාවගේ ජීවිතවලට බලපාන සෞඛ්‍ය සේවාව මේ තරම් අකර්මණ්‍ය කර තැබීම ගැන ප්‍රබල හඬක් නැගිය යුතුයි. අධ්‍යාපනය සහ සෞඛ්‍යය කඩා වට්ටන්න ආණ්ඩුව ගෙනයන ක්‍රියාමාර්ග ගැන ජනතාව දැනුවත් කළ යුතුයි. ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය, ඔවුන්ගේ පෞද්ගලික අරමුණු, ඔවුන්ගේ ළබැඳියාවන් වගේම දේශපාලන සංස්කෘතියේ බරපතළ වංචා - දූෂණවලින් පිරී ඉතිරී පවතිනවා. ඖෂධ සහ උපකරණ ජාවාරම සමග එකට ගැටගැසෙන ජනතාවගේ ජීවිත අනතුරට හෙළනවා. දරුවන්ගේ අනාගතය පිළිබඳ ප්‍රශ්නය මේ එක්කම ගැටග ැසී තිබෙනවා. මේ පවතින ආර්ථික ප්‍රශ්න හමුවේ පැත්තකට ගැනීමට ඉඩනොදී සෞඛ්‍යය සහ අධ්‍යාපනය පිළිබඳ අවශ්‍ය හඬ ජාතික ජනබලවේගය ගොඩනඟනවා.

> **ජාතික නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීමේ මූලික කාර්යභාරය වෙනුවෙන් අධ්‍යාපනය සහ සෞඛ්‍යය පදනමින්ම නැවත සකස් කළ යුතුයි. වෙළඳපොළ අවශ්‍යතාවයට අධ්‍යාපනය සහ සෞඛ්‍යය පසුගිය දශක ගණනාවක් ගෙනයමින් තිබුණා. නමුත් එය වෙනස් කර, මානව සම්පත දියුණු කිරීමේ සහ ආරක්ෂා කිරීමේ අරමුණු සහගතව රජයේ වගකීමක් ලෙස මේ අංශ දෙකම නවීන ලෝකයත් සමග ඉදිරියට ගෙන යා යුතුව තිබෙනවා.**

ජනතාවගේ ජීවිතවලට බලපාන මූලධාර්මික ප්‍රශ්නය මේක. ප්‍රශ්නය පුළුල් ලෙස විග්‍රහ කර, බරපතළකම ගැන අවධාරණය කරගෙන දරුවන්ට රටක් නැති කර ජනතාව විනාශ කරන මේ පාලනය අවසන් කිරීම වෙනුවෙන් ජනතාව සංවිධානය සහ ඒකරාශී කළ යුතුව තිබෙනවා.

***නියමුවාඃ- ඔබ කියන මූලධාර්මික ප්‍රශ්නය වර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්නේ කොහොමද?***

***වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයාඃ-*** විශේෂයෙන්ම අධ්‍යාපනය ගත්තොත් ඒ වෙනුවෙන් දරන බර පවුල මත පැටවී තිබෙනවා. අද අම්මලාට දරුවන් සමග පාසල් යාමට සිදුවී තිබෙනවා. දරුවා පාසලට භාරදීමේ සිට අම්මලාට විශාල බරක් ඇදගෙන යාමට සිදවෙලා. මේ විශාල මහන්සියක් දරා උගන්වන දරුවාට බලාපොරොත්තු වෙන අධ්‍යාපනය ලැබෙනවාද? තරගකාරී පුද්ගල කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය නිසා ආර්ථිකයට අවශ්‍ය සුදුසු පුද්ගලයා බිහිවෙන්නේත් නැහැ. සමාජය ශිෂ්ට සම්පන්න තැනකට ගෙනයාමට අවශ්‍ය පුද්ගලයා බිහිවෙන්නේත් නැහැ.

වෘත්තීය අධ්‍යාපනය ලබාදෙන් ආයතනවලත් බරපතළ ගැටලු පැනනැගී තිබෙනවා. එම ආයතන මුදල් අයකරන පාඨමාලා බවට පත්වෙමින් යනවා. විශ්වවිද්‍යාල තුළත් අද බරපතළ ප්‍රශ්න පැනනැගී තිබෙනවා. ආහාර ප්‍රශ්නය, අනාරක්ෂිත තාවය, ප්‍රවාහන අපහසුතා, නවාතැන් පහසුකම් නැති නිසා, විශ්වවිද්‍යාල තුළින් ළමුන් ඉවත්වීමට හේතුවී තිබෙනවා. විශවවිද්‍යාලය කියන්නේ සමාජ ප්‍රගමනය සිදුකරන, අලුත් ඉදිරි පිම්මක් ලබාදෙන, දැනුම නිර්මාණය කරන තැනක්, විය යුතුයි. විශ්වවිද්‍යාලයක් ජාත්‍යන්තර මට්ටමින් පිළිගන්නවාද නැද්ද යන්න තීරණය වෙන්නේ එයින් නිර්මාණය වන අලුත් දැනුම. අලුත් දැනුම නිර්මාණය වෙන්නේ පශ්චාත් උපාධි ආයතන. අද පශ්චාත් උපාධි ආයතන බොහොමයක් තිබුණත්, කෘෂිකර්ම, වෛද්‍ය, කළමනාකරණය, විද්‍යාව, යන ආයතනවලට ආණ්ඩුව කිසිදු මුදලක් මේ වන තෙක් වෙන්කර නැහැ. අද ඒවායේ අරමුණු බරපතළ ලෙස විකෘති කර තිබෙනවා.

අනෙක් අතට අපේ සෞඛ්‍ය සේවය පිළිබඳව ලෝකයේ යම් පිළිගැනීමක් තිබුණා. ආර්ථික වශයෙන් කඩාගෙන වැටුණාට සෞඛ්‍යමය වශයෙන් ඉහළ මට්ටමක පැවතුණු බවට සාකච්ඡාවක් තිබෙනවා. මේ වන විට ජාතික රෝහලේ සිට හයසිය හතළිස් තුනක් පමණ වන රෝහල් පද්ධතියක් 522ක් පමණ ප්‍රාථමික සෞඛ්‍ය ඒකක පිහිටුවා ලක්ෂයකට වඩා වැඩි සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදී සිටිනවා. ඇඳන් 85,000ක් පමණ නේවාසික රෝගීන්ට වෙන්වී තිබෙනවා. මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාස 356ක් තිබෙනවා. මම මේ කියන්නේ රෝග නිවාරණ කටයුතු සඳහා විධිමත් ජාලයක් ස්ථාපිත කර තිබෙන බවයි. මේ නිසා මාතෘ මරණ, ළමා මරණ, වගේ දර්ශකවලින් අපි ඉදිරියට පැමිණ සිටියා. 1990 දී තිබූ ලක්ෂයකට 75ක් පමණ වූ මාතෘ මරණ සංඛ්‍යාව වර්තමානයේ 36ට අඩුවී තිබෙනවා. අවුරුද්දට අඩු ළදරු මරණ 1990 දී 13 සිට දැන් 04 දක්වා අඩුවී තිබෙනවා. 1990 දී අවුරුදු 05ට අඩු දරුවන්ගේ මරණ 17ක් වූ නමුත්, අද 07 දක්වා අඩුවී තිබෙනවා.

අද පවා මෙවැනි තත්වයක් තිබෙන්නේ 1978 හඳුන්වා දුන් නව ලිබරල් ආර්ථිකයේ විශාල ගෙල හිරකිරීමකට සෞඛ්‍ය සේවය පත්කර තිබෙන පසුබිමක බව අපි අමතක නොකළ යුතුයි. තව පැත්තකින් සෞඛ්‍යය ගැන දැන් ලෝකය සාකච්ඡා කරන්නේ තිරසර සංවර්ධන දර්ශක පදනම් කරගෙන. සෞඛ්‍යය සම්බන්ධයෙන් අලුත් දර්ශක ප්‍රමාණයක් හඳුන්වා දී තිබෙනවා. මාතෘ මරණ සහ ළදරු මරණවලට වගේම කෙතරම් සියදිවි නසා ගන්නවාද, රටේ මානසික සෞඛ්‍ය තත්වය කොහොමද, බෝ නොවන රෝගවලින් කොපමණ ජනතාවක් මිය යනවාද, ජනගහනයෙන් කොපමණ ප්‍රමාණයක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටිනවාද, අනතුරුවලින් කොතරම් ප්‍රමාණයක් මිය යනවාද, රටේ ජනගහනයෙන් කොපමණ පිරිසක් සෞඛ්‍යය වෙනුවෙන් පුද්ගලිකව මුදල් වියදම් කරනවාද, වගේ අලුත් දර්ශක ප්‍රමාණයක් රටක සෞඛ්‍ය තත්වය ගැන සාකච්ඡාවට යොදා ගන්නවා.



ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික
**වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා**

නමුත් මේ නිර්ණායක එක්ක අද අපි ලෝකයේ ඉන්නේ හොඳ තැනක නොවෙයි. රටේ සෞඛ්‍ය පද්ධතිය ජනතාව එක්ක කොතරම් ගැටගැසී තිබෙනවාද, යන්න තක්සේරු කිරීමට " සමස්ත සෞඛ්‍ය ආවරණය" නම් නිර්ණායකය යොදා ගන්නවා. ලංකාව ඒ දර්ශකයේ ඉන්නේ හැටහත්වෙනි ස්ථානයේ. දුර්වලම අය ලකුණු බිංදුවකුත් හොඳම අය ලකුණු 100කුත් ලබා ගන්නා මේ නිර්ණායකය සිංගප්පූරුව ලකුණු 86ක්, දකුණු කොරියාව ලකුණු 86ක්, චීනය 82ක්, කියුබාව 80ක් නවසීලන්තය 86ක් ලබාගෙන තිබෙනවා. එක් කාලයකදී ලංකාවට වඩා පහළින් ආර්ථික දර්ශක සටහන් වූ රටවල් තමන්ගේ ආර්ථිකයත් වර්ධනය කරගෙන ජනතාවට ඉහළ සෞඛ්‍ය සේවයක් ලබාදී තිබෙනවා. අපි ආසියාවේ සහ දකුණු ආසියාවේ කප් එක ගහලා ඉඳලා වේගයෙන් පල්ලම් බහිනවා.

***නියමුවාඃ- මේ කඩාවැටීමට ආර්ථික දර්ශකවලටත් වඩා දූෂිත දේශපාලන සංස්කෘතියේ බලපෑම තිබෙනවා නේද?***

***වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයාඃ-*** අපේ රටේ පවතින්නේ ආණ්ඩු මාරු කළාට ඇමතිවරු සහ නිලධාරීන් ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යන දූෂිත දේශපාලන නිලධාරී යාන්ත්‍රණයක්. මේ දූෂිත චෞර වළල්ලට රෝගීන්ගේ ජීවිත පිළිබඳ කිසිම හැඟීමක් නැහැ. ඔවුන්ගේ අරමුණම ජාවාරම්කාරී, ආර්ථික දේශපාලනයක් පවත්වාගෙන යාම පමණයි. ලංකාවට අවශ්‍ය ඖෂධවලින් 75% ක් ගෙන්වන්නේ සමාගම් තුනකින්. මේ නිසා ජනතාවට දරාගත නොහැකි මිලක් නියමකර තිබෙනවා. ඒ වගේම වර්තමානයේ ඖෂධ හිඟයක් සැලසුම් සහගතවම නිර්මාණය කරමින් ඉහළ මිලකට අලෙවි කරන ජාවාරමක් පවතිනවා. ඒත් එක්කම ඇඳුණු ඖෂධවල ගුණාත්මකභාවය පිළිබඳ කිසිම තැකීමක් කරන්නේ නැහැ. පේරාදෙණිය ශික්ෂණ රෝහලේ නිර්වින්දන ඖෂධ නිසා තුන්දෙනෙක් මිය ගියා. වරක් රුසියාවෙන් ගෙන්වන ලද අලුත් ඖෂධයක් පියයුරු පිළිකාව සඳහා භාවිතා කළ නොහැකි බව බව පැවසූ පිළිකා විශේෂඥ වෛද්‍යවරුන්ට විනය පරීක්ෂණ නියම කර, රෝහල්වලට බලෙන් ඒ ඖෂධ ලබාදුන්නා. ඒ කාලයේ සිටි ඖෂධ සංස්ථාවේ සභාපති සහ ඒ ඖෂධ ගෙන්වූ සමාගම විසින් වෛද්‍යවරුන් මත බලහත්කාරය පටවා ඇති බව පසු කාලයකදී පරීක්ෂණවලින් හෙළිවුණා. දැන් නැවතත් සභාපති ලෙස කටයුතු කරන්නේ ඒ ඉවත් කළ සභාපතිමයි.

ඒ වගේම ඉන්දියාවෙන් ගෙන්වන සමහර ඖෂධ වෙනුවෙන් නියමිත අව්‍යාජ සමාගම් ටෙන්ඩර් ඉදිරිපත් කළත්, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ආනයනය කර තිබෙන්නේ ලේබල් වෙනස් කළ, ප්‍රමිතියෙන් තොර ඖෂධ බව හෙළිවී තිබෙනවා. මෙවැනි මාෆියා තවමත් ක්‍රියාත්මකයි. සමහර රෝගීන් මරණයට පත්වුණේ මේ මාෆියාවල ප්‍රතිඵලයක් විදිහට. අපේ අවධානය ඖෂධ හිඟය ගැන වගේම මිල වැඩිවීමත්, ගුණාත්මකභාවයත් යන කරුණු තුන කෙරෙහිම යොමු කළ යුතුයි. මේ පිටුපස තිබෙන්නේ අන්ත දූෂිත, ජරාජීර්ණ දේශපාලන සංස්කෘතිය බව අපි දන්නවා.

***නියමුවාඃ- ආණ්ඩුවේ බදු පීඩනය සහ කලකිරීම් හමුවේ වෛද්‍යවරුන් විශාල වශයෙන් රට අතහැර යමින් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබේ අවධානය යොමු කරන්නේ කෙසේද?***

***වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයාඃ-*** අද අපේ රෝහල් පද්ධතියත් අකර්මණ්‍ය වෙලා හොඳ සෞඛ්‍ය සේවයක් සපයන්න අවශ්‍ය සියලුම අංශ බිඳ දමා පවතින්නේ. නමුත් විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළු සමස්ථ වෛද්‍යවරුන් රට අතහැර යාම ගැන විශේෂ අවධානය යොමු වනවා. කෙසේ නමුත් මේ වෙනකොට වෛද්‍යවරුන් පමණක් නොව විවිධ පරාසවල සිටින කාර්ය මණ්ඩලය ඉවත්වී යනවා. මෑතක් වන තුරු රට තුළ විශේෂඥ වෛද්‍යවරුන් 2300ක් සිටියා. 2025 වන විට අවශ්‍ය වෙන සංඛ්‍යාව 4000ක් බව ඇස්තමේන්තු කර තිබෙනවා. නමුත් දැන් ආණ්ඩුවේ බදු පීඩනය විසින් ඔවුන්ව විදේශගත වෙන තත්වයට පත්කර තිබෙනවා. තවත් අය පිටරට ගියේ ලොකු වැටුපක් බලාගෙන නොවෙයි, තමන්ගේ දරුවන්ගේ අනාගත සුරක්ෂිතතාවය ගැන හිතලා. මේ ගොඩක් අය සේවයෙන් ඉවත්වීමේ ලිපියක් වත් භාරදී යන අය නොවෙයි. විශේෂඥ වෛද්‍යවරුන් රට අත්හැර යාම වගේම මේ 30දා වන විට 148 දෙනෙක් විශ්‍රාම යාමට නියමිතයි. වසර අවසන් වන විට 600ත් 700ත් අතර පිරිසක් රට අත්හැර යාමට ඉඩ තිබෙනවා. විශේෂඥ වෛද්‍යවරයෙක් පාන් බානවා වගේ බිහි කරන්න බැහැ. විශ්වවිද්‍යාලයට ඇතුල් වූ තැන ඉඳලා අවුරුදු 12ක් වත් ගතවෙනවා.

මට ලැබුණු වාර්තාවක් අනුව සාමාන්‍යයෙන් වෛද්‍යවරු 18,600ක් පමණ සිටියත් මේ වන විට සෑම මාසයකම 1500ක් - 1700ක් අතර පිරිසක් රටින් පිටවී යාම ගැන කල්පනා කරමින් ඉන්නවා. අපේ රටේ පර්යන්ත රෝහල් 50කට ආසන්න ප්‍රමාණයක් වැසීයාමේ තර්ජනයක් මතුවෙලා තිබෙන්නේ. දැනට ඉතිරිව ඉන්න විශේෂඥ වෛද්‍යවරුන් කොහොම හරි ඉදිරියට ඇදගෙන ගියත් මේ විදිහට යා හැකි සීමාවක් තිබෙනවා. විශේෂඥ වෛද්‍යවරු ඉතිරි වුණත් උදව්වට සාමාන්‍ය වෛද්‍යවරු නැත්නම් කිසිවක් කර ගන්න බැහැ. සමහර රෝහල්වල හදිසි ශල්‍යකර්ම සිදුකිරීම පවා හිටිහැටියේ අත්හිටුවන්න සිදුවෙනවා. වෛද්‍යවරුන් පමණක් නොවෙයි ලෝකයේ මේ වන

11 වැනි පිටුවට

# ශ්‍රී ලංකාව, දඩයක්කරුවන්ගේ ග්‍රහණයෙන් මුදා ගන්න සාමූහිකව වැඩකරමු

ජාතික ජන බලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයාගේ ඕස්ට්‍රේලියානු සංචාරයේ කොටසක් ලෙස ජුනි 24 දින මෙල්බර්න්හිදී ශ්‍රී ලාංකේය ප්‍රජාව සමග පැවති හමුවේදී දක්වන ලද අදහස්වල සංක්ෂිප්ත සටහනක්.

## ජාතික ජන බලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයා



රට ස්වෛරීභාවය ස්වාධීනත්වය රඳා පවතින්නේ ඒ රට කොතරම් ආර්ථික අතින් ශක්තිමත්ද කියන සාධකය මතයි. ජනගහනය, රටේ විශාලත්වය, හමුදාවේ ප්‍රබලත්වය යන හැම දේටම වඩා රටක ආර්ථික ශක්තිමත්භාවය වැදගත්. ලෝකයේ ඕනෑම රටක් තවත් රටක් ඉදිරියේ පිළිගැනීමට ලක් වන්නේ ඒ රට මොනතරම් ආර්ථික අතින් ශක්තිමත්ද කියන සාධකය මත. අපේ රටේ පාලකයන් දීර්ඝ කාලයක් තිස්සේ රටක ඉදිරියේ තිබෙන සියලුම පන්නයේ විනාශයන් සිදුකොට හමාරයි. මේ මොහොතේදිත් හෘද සාක්ෂියක් තිබෙන, ඇස් පෙනෙන, මිනිසුන් හැටියට අතිශය තීරණාත්මක අවස්ථාවක අපි හමුවී සිටිනවා.

### ආර්ථිකයට සිදු කළ දේ

අපේ ආර්ථිකය රට තුළ වියදම් කිරීම සඳහා රුපියල් අවශ්‍ය ප්‍රමාණයක් නොලැබීමත්, විදෙස් ගනුදෙනු සඳහා අවශ්‍ය ඩොලර් ප්‍රමාණය නොලැබීමත් කියන ප්‍රධාන ආර්ථික ප්‍රශ්න දෙක පවතිනවා. වසර කිහිපයක් රජය උපයා ගත් ආදායම, ණය පොලී වාරික ගෙවීමටවත් ප්‍රමාණවත් වුණේ නැහැ. රටක භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම මත පනවන බදුවලින් භාණ්ඩාගාරයට ආදායම් ලැබෙනවා. නමුත් ලංකාවේ ඒ සඳහා ප්‍රමාණවත් තරම් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන්නේ නැහැ. දශක ගණනාවක් තිස්සේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ආර්ථිකයක් අපි ගොඩනගා ගත්තේ නැහැ. ශ්‍රී ලංකාවේ අනාගතය රඳා පවතින්නේ එකට වෙලී තිබෙන ලෝකයේ වෙළඳපොළෙන් අපි අත්පත් කර ගන්නා ප්‍රමාණය අනුවයි. ඉතා වේගයෙන් කිට්ටුවෙමින් තිබෙන ලෝකයේ අපේ පංගුව රැකගන්න අපි අසමත් වුණා. ලෝකයේ අලුත් තාක්ෂණයෙන් භාණ්ඩ හා සේවා වෙළඳපොළ වේගයෙන් දියුණු වුණත්, ඒ වෙළඳපොළ අත්පත් කර ගන්න අපි ක්‍රියාකළේ නැහැ. ඒ නිසා වාර්ෂිකව විදේශ වෙළඳාමෙන් සිදුවන පාඩුව මගහරවා ගන්න විදේශ ණය ගන්න පටන් ගත්තා. ඒ නිසා 2020 වන විට ජාත්‍යන්තර මූල්‍ය විශ්ලේෂණ සමාගම් ලංකාවට ණය දීම අවදානම් බව ප්‍රකාශ කරන්න පටන් ගත්තා. ඒ නිසා විදේශ ණය දෙන එක නැතිව ගියා. දැන් යම් ප්‍රමාණයකට තෙල්, ගෑස්, කිරිපිටි තිබෙනවා. අපි ගෙවිය යුතු විදේශ ණය මේ මැයි වන විට ඩොලර් බිලියන 4.5ක් ගෙවා නැහැ. ඒ ණය ගෙව්වාම 2022 මාර්තුවලටත් වඩා තත්වය භයානකයි. මේ තිබෙන්නේ ආර්ථික සැලසුමක ප්‍රතිඵලයක් නොවෙයි; ණය නොගෙවීමේ ප්‍රතිඵලයක්. ඒ නිසා පවතින තත්වය වඩාත් භයානකයි.

දීර්ඝ කාලයක් අනුගමනය කරන ආර්ථික ප්‍රතිපත්තිය වෙනුවට ජාතික ජන බලවේගය නව ආර්ථික උපායමාර්ගයක් හඳුන්වාදී ක්‍රියාත්මක කරනවා. ඒ වගේම අපේ රටේ පවතින දේශපාලන සංස්කෘතියත් වෙනස් කරන්න ඕනෑ. සමහර ව්‍යාපෘති සිදුවෙන්නේ අපේ රටේ අවශ්‍යතාවයට නොව ඒ අවස්ථාවේදී දේශපාලකයාට ලැබෙන කොමිස් කුට්ටිය මතයි. ඉන්දියාවට, චීනයට අවශ්‍ය ආර්ථික දේශපාලනික උපායමාර්ග අනුව වරායවල් පෝර්ට්සිටි අරගෙන එනවා. ඒ ආර්ථික උපායමාර්ග අපේ රටට ගැලපෙන්නේ නැහැ. අපේ රටේ තෙල් පිරිපහදුව පිහිටවූයේ 1969දී. තෙල් මෙට්‍රික් ටොන් 5000ක් නිෂ්පාදනය කිරීමෙන් එය ආරම්භ කළා. අද මෙට්‍රික් ටොන් 20,000ක් අවශ්‍යයි. අද ඒක අවුරුදු 54ක් පැරණි තාක්ෂණයක්. අලුත් තාක්ෂණය එකතු කර පිරිපහදුවේ ධාරිතාවේ වැඩිකිරීම මේ අවස්ථාවේ ප්‍රමුඛතම අවශ්‍යතාවයක්. පිරිපහදුවේ නවීකරණය ආර්ථික සැලැස්මේ උපායමාර්ග යක් ලෙස ඉදිරියට ගන්නවා වෙනුවට හම්බන්තොට වරාය ඉදිරියට ගත්තා. අපේ රට ගොඩගන්න නම්, මේ දූෂිත දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න ඕනෑ.

### නව දේශපාලන සංස්කෘතියක්

ඇමතිවරයා අද පුටුවේ වාඩිවෙන්නේ දවසේ ආදායම කොපමණ හොයනවාද කියලා. ඇමතිවරයා අත්සන ගහන්නේ යම් ආයෝජකයෙක්ගේ ආදායමෙන් පංගුවක් තමන්ටත් අයිති බව සිතමින්. අපි කාටත් දේශපාලනය පිළිකුල් බවට පත්කළ මේ දේශපාලන පොරපිටිය අපි පිරිසිදුභාවයට පත්කරනවා. ඒ වෙනුවෙන් අපි අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කර ගන්නවා. අපේ රටේ 1978 සිට අවුරුදු 45ක් විධායක ජනාධිපති ක්‍රමය යටතේ ඔප්පු කර තිබෙන්නේ පාලකයන් එම පුටුවේ වාඩිවෙන්න සුදුසු නැති බවයි.තනි මිනිහෙක් අත විශාල දේශපාලන අධිකාරී බලයක් තබාගෙන සියල්ලන්ම යටත් කරගෙන සිටීම අපේ රටේ දේශපාලන සංස්කෘතිය විනාශ කරන්න විශාල වශයෙන් හේතු වුණා.

පිල් මාරුකිරීමත් දේශපාලන සංස්කෘතිය විනාශ කරන්න විශාල වශයෙන් හේතු වුණා. 1994 සිට ඉන්න ඇමතිවරු ඉන්නවා. ජනතාව ආණ්ඩු මාරු කළත් මාරු නොවෙන ඇමතිවරුන් ඉන්නවා. පනින්න විතරක් නොවෙයි නැවතී ඉන්නත් සල්ලි ගන්න මන්ත්‍රීවරු ඉන්නවා. පැන්නොත් මන්ත්‍රී ධුරය අහෝසි කරන ප්‍රතිඵල අපි ව්‍යවස්ථාවට ගේනවා. අමාත්‍ය ධුර සීමා කිරීම සහ අමාත්‍ය ධුරවලට නිශ්චිත ආයතන නම් කිරීම අපි ව්‍යවස්ථාවට ඇතුළත් කරනවා. ඒ වගේම මන්ත්‍රීවරුන්ට ලබාදෙන විශ්‍රාම වැටුප අහෝසි කරනවා. මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප් දීම සාධාරණ නැහැ. පුරවැසියන් දීර්ඝකාලයක් වැඩකළාම ලැබෙන විශ්‍රාම වැටුප මන්ත්‍රීවරයාට වසර පහකින් ලැබීම දේශපාලන සංස්කෘතියේ ප්‍රශ්නයක්. අපි ඒක වෙනස් කරනවා. ඒ වගේම මන්ත්‍රීවරුන්ට ලබාදෙන පර්මිට් එක අහෝසි කරනවා. මෙන්න මේ නීතිමය සහ භාවිතාවන්ගේ කටයුතු වෙනස් කර, දේශපාලන සංස්කෘතිය වෙනස් කරනවා. ඒ වගේම නීතියේ විධානය සහ ආධිපත්‍යය රටකට ඉතාම වැදගත් මූලධර්මයක්. මිනිසුන් තුළ අධිකරණ කෙරෙහි විශ්වාසයක් තහවුරු වෙන්න ඕනෑ. නීතියේ විධානය කඩා වැටුණාම සමාජයක් අශිෂ්ටභාවයට පත්වෙනවා. එය වෙනස් කරන බවට අපි ඔබට සහතික වෙනවා.

මිනිස්සු අතින් වැරදි නොවන බව මම කියන්නේ නැහැ. මේ සමාජයම නියෝජනය කරන විශාල මිනිස් සමූහයක් ඉන්න ජාතික ජන බලවේගයේ අය අතින් වැරදි විය හැකියි. ඕනෑම සමාජයකට ඒක වලංගුයි. මිනිස් සමාජය කියන්නේ එහෙම එකක්. නමුත් වැදගත් වෙන්නේ හැමකෙනාටම එක හා සමාන ආකාරයට නීතිය ක්‍රියාත්මක කිරීමයි. ඒ වගේම ලෝකයේ කිසිම රටක් ජන කොට්ඨාස සමග ඈත කොටාගෙන දියුණු වුණේ නැහැ. දියුණු වූ සෑම රටකම ආගමික වශයෙන්, ජාතික වශයෙන්, ඒකාබද්ධ වීම වැදගත්. තම තමන්ගේ භාෂාවල වෙනස්කම් සංස්කෘතියේ වෙනස්කම්, ආගමික ඇදහිලිවල වෙනස්කම්, පිළිගනිමින් ඒවාට ගරුකරමින් ඒ සියල්ල ඉක්මවා යන ශ්‍රී ලාංකික ජාතිය ගොඩනගන්න ඕනෑ.

පාලකයා හැමදාමත් අසාර්ථක වුණාම ජාතිවාදය හා ආගම්වාදය උඩට ගේන නිසයි, මම මේ බව අවධාරණය කරන්නේ. ඉතාමත් සැලසුම් සහගතව නැවතත් ජාතිවාදී හා ආගම්වාදී ගැටුම් වර්ධනය කෙරෙමින් තිබෙනවා. පාලකයා හැමදාමත් සිංහල, දෙමළ, මුස්ලිම් එකිනෙකා කෙරෙහි සැකය වර්ධනය කළා. අවිශ්වාසය ක්‍රෝධය වර්ධනය කළා. ඊළඟ මැතිවරණයට අලුත් පන්නයේ ගැටුමක් නිර්මාණය කිරීමේ ලකුණු තිබෙනවා. දැන් සිදුවෙමින් තිබෙන දේවල් එකම මූලයකින් පැන නගින්නේ නැහැ කියලා බැහැර කළ හැකිද? ඒ තරමටම මේ පාලකයන් තමන්ගේ බලය වෙනුවෙන් ජාතිවාදය හා ආගම්වාදය යොදා ගන්නවා. ඒ නිසා අපි ජාතිවාදයට ආගම්වාදයට එරෙහිව ජාතික සමගිය සහ ආගමික සමගිය තිබෙන රටක් නිර්මාණය කරන්න ඕනෑ.

> පාලකයා හැමදාමත් අසාර්ථක වුණාම ජාතිවාදය හා ආගම්වාදය උඩට ගේන නිසයි, මම මේ බව අවධාරණය කරන්නේ. ඉතාමත් සැලසුම් සහගතව නැවතත් ජාතිවාදී හා ආගම්වාදී ගැටුම් වර්ධනය කෙරෙමින් තිබෙනවා. පාලකයා හැමදාමත් සිංහල, දෙමළ, මුස්ලිම් එකිනෙකා කෙරෙහි සැකය වර්ධනය කළා. අවිශ්වාසය ක්‍රෝධය වර්ධනය කළා. ඊළඟ මැතිවරණයට අලුත් පන්නයේ ගැටුමක් නිර්මාණය කිරීමේ ලකුණු තිබෙනවා. දැන් සිදුවෙමින් තිබෙන දේවල් එකම මූලයකින් පැන නගින්නේ නැහැ කියලා බැහැර කළ හැකිද? ඒ තරමටම මේ පාලකයන් තමන්ගේ බලය වෙනුවෙන් ජාතිවාදය හා ආගම්වාදය යොදා ගන්නවා. ඒ නිසා අපි ජාතිවාදයට ආගම්වාදයට එරෙහිව ජාතික සමගිය සහ ආගමික සමගිය තිබෙන රටක් නිර්මාණය කරන්න ඕනෑ.

එයට සමගාමීව අපේ ආර්ථික උපායමාර්ගය දියත් කරන්න ඕනෑ. අපේ පිහිටීම මත වගේම ස්වභාවික සම්පත, මානව සම්පත, විදේශ සම්බන්ධතා සහ අපේ ශිෂ්ටාචාරය මත පදනම් වූ ආර්ථිකයක් අපි ගොඩනගනවා. අපේ ශිෂ්ටාචාරය අත්හැරලා ආර්ථිකය ගොඩනගන්න බැහැ. දේශපාලන සංස්කෘතිය වෙනස් කර, නව ආර්ථික උපායමාර්ගයක් සහිතව මේ රට ගොඩනඟනවා. රේගුව, දේශීය ආදායම්, සුරාබදු සහ ආගමන විගමන දෙපාර්තමේන්තුව වගේම වරාය, ඛනිජතෙල්, විදුලි බල මණ්ඩලය, ජල සම්පාදනය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය කියන අංශ එන්න වේගයෙන් පොරබදලා ඉක්මනින් වෙනස් කරන්න ඕනෑ. ආර්ථිකයේ මර්මස්ථාන තෝරාගෙන, ප්‍රමුඛත්වය දෙන සැලසුමක් අපට තිබෙනවා.

### කුමන්ත්‍රණ පරදවා ජයගනිමු

අපි බලය ලබාගැනීම වළක්වන්න ප්‍රධාන ක්‍රියාමාර්ග තුනක් වර්තමාන පාලකයන් අනුගමනය කරමින් සිටිනවා. ඔවුන්ට අනුව දේශපාලනය මාරාන්තික සන්ධිස්ථානයකට පැමිණ සිටිනවා. පාලනයේ සුක්කානම ජාතික ජන බලවේග යට දෙන්න ඕනෑ කියන තැනට ජනතාව පෙළගැසී සිටිනවා. මේ ප්‍රවාහය නතර කිරීමට මැතිවරණ සිතියම අකුළන්න උත්සාහ කරනවා. ඡන්දය කල්දැමුවාට පස්සේ අපි ගැටුමකට යන්නේ නැහැ. අපි මේ පිට්ටනියේ ජනතාවත් එක්ක සංවාද කරනවා. නැවත නැවත ජනතාව සංවිධානය කරනවා. දෙවැනි පියවර හැටියට ඒගොල්ලෝ එකතු කළ හැකි සියලු සංවිධාන එකතු කර ගනිමින් යනවා. අනික් පැත්තෙන් තුන්වෙනි පියවර හැටියට නැවත ජාතිවාදී හා ආගම්වාදී ගැටුමක් ඇති කරන්න උත්සාහ කරනවා.

මේ ව්‍යායාමය පහසුවෙන් කරගෙනයාමට ඒගොල්ලෝ ඉඩ දෙන්නේ නැහැ. ඒගොල්ලන්ට නැතිවෙන්නේ වර්තමාන ජනාධිපති ධුරය පමණක් නොවෙයි. අනාගත දේශපාලන බලයත් නැතිවෙනවා. ඒගොල්ලන්ගේ බලය අහිමි වීම ඒගොල්ලන්ට දේශපාලන වශයෙන් මාරාන්තිකයි. ශ්‍රී ලාංකික ජනතාව වෙනස් ලෝකයක් දකිනවාට පාලකයො බයයි. අපේ රටේ විශාල ජනතාවක් වෙනස් ලෝකයක් අත් විඳිනවා. ලෝකයට ඇස් විවෘත වීම ඒගොල්ලන්ට භයානකයි. අපේ රට සුපර් මෑන්ලාගෙන් ගොඩගන්න බැහැ. අපි සුපර් මෑන්ලා නොවෙයි. දන්න දේවල් වගේම නොදන්නා දේවල් බොහොමයක් තිබෙනවා. හැකියාවන් වගේම දුර්වලකම් තිබෙනවා. අපි ස්වභාවික මිනිස්සු. හැබැයි අපිට මේ රට ගොඩනැගීමේ අපේක්ෂාවක් තිබෙනවා. ඒ වෙනුවෙන් හැකියාව, දක්ෂතාවය, දැනුම් තිබෙන සෑම කෙනෙක්ම උකහා ගන්න තිබෙන එකම ව්‍යාපාරය ජාතික ජන බලවේගයයි. ශ්‍රී ලංකාව මේ දඩයක්කරුවන්ගේ ග්‍රහණයෙන් මුදා ගන්න අපි සාමූහිකව එක්වී වැඩකරමු.


# ආපස්සට යන රට
# ඉදිරියට යන ණය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය සහනය තවදුරටත් සහනයක් වනවා වෙනුවට අසහනයක්ම බව දැන් සිදුවෙමින් පවතින ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියෙන් ජනතාවට දැනෙමින් පවතී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 'සහනශීලී' ණය ලබාගන්නා පළමු මොහොතේ ආණ්ඩුවේ තර්කය වූයේ මෙම ණය මගින් මෙතෙක් බිඳවැටෙමින් පවතින ජාත්‍යන්තර ප්‍රජාවගේ ආයෝජන විශ්වාසය ලංකාවට යළි දිනාගත හැකි බවයි. ඒ නිසා මූල්‍ය අරමුදලේ පිහිට පැතීම හැර වෙනත් විකල්පයක් නොමැති බව මෙම දූෂිත ක්‍රමය ආරක්ෂා කරන බොහෝ මධ්‍යස්ථ මතධාරීන්ගේ අදහසද විය. ඒ නිසා ණය මුදලේ ප්‍රමාණය (ඩොලර් බිලියන 2.9) ගැන නොසලකා මෙමගින් ලැබෙන ප්‍රතිලාභ සමස්තය දෙස බලන මෙන් ඔවුන් ජනතාවට මත පළ කළහ.

ඒ වනවිට -8.3ක ආර්ථික කඩා වැටීමක් පැවති අතර ආහාර උද්ධමනයද 90% ඉක්මවීය. මූල්‍ය අරමුදලේම විග්‍රහයන්ට අනුව ණය බර ඉහළ යෑමේ වේගය 2023 වසර අවසාන වන විට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 128%ක් වනු ඇතැයි ප්‍රකාශ විය. තවදුරටත් ණය ගෙවිය නොහැකි මෙන්ම ණය ලබාගත නොහැකි රටක් බවට ලංකාව පත්විය. 2022දී නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ඩොලර් මිලියන 75,296ක් වනවිට මුළු රාජ්‍ය ණය පංගුව ඩොලර් මිලියන 84,703ක් ලෙස ගණනය කර ඇත. ආර්ථික විශ්ලේෂකයින්ගේ මත අනුව මෙම ණය ප්‍රමාණය 2023 ජූනි මාසයේ අවසානයට ඩොලර් මිලියන 97,111ක් පමණ වනු ඇති බව පුරෝකථන කර ඇත.

## ආණ්ඩුවේ උපක්‍රමය

ගතවුණු කාලය තුළ ආණ්ඩුව තම උපක්‍රමික සැලැස්ම බවට පත්කර ගත්තේ විදේශ විනිමය ඉපයීම් මගින් විනිමය අර්බුදයට පිළිතුරු සොයනු වෙනුවට විනිමය පාලනය මගින් ආර්ථිකය සංකෝචනය කර පවත්වාගෙන යාමයි. ඒ සඳහා වරින් වර ආනයනික භාණ්ඩ සඳහා සීමා පනවන ලදී. භාණ්ඩ 1675ක් පමණ ගැසට් කර එක වර ආනයන සීමා ඇති කරන ලදී. ඩොලර් හුවමාරුව පාලනය කිරීමට හා කෘත්‍රිම ලෙස රුපියල ශක්තිමත් කිරීමට මහ බැංකුවේ විනිමය පාලන උපකරණ යොදා ගන්නා ලදී. බදු පැනවීම් මගින් භාණ්ඩ පාරිභෝජනය සීමා කළ අතර විදුලි මිල ඉහළ දැමීම, ඉන්ධන මිල ඉහළ දැමීම, ඉදිකිරීම් ක්ෂේත්‍රය මුළුමනින්ම අර්බුදයට යැවීමට සලස්වන ලද අතර ඒ තුළින් ඇතිවන රැකියා අහිමි වී යන ජනතාව ගැන අනුකම්පා විරහිත ලෙස ආණ්ඩුව ක්‍රියා කරන ලදී. ඒ වෙනුවට කඩා වැටුණු කර්මාන්ත, සුළු හා මධ්‍යම ව්‍යාපාර යළි ශක්තිමත් කර නගා සිටුවීම රාජපක්ෂ පාලනයේදී මෙන්ම රනිල් වික්‍රමසිංහද සලකා බැලුවේ නැති කරදර ඇතිකර ගැනීමක් ලෙසටය.



"තමන්ගේ (IMF හි) වැඩසටහන් වැඩකරන බව පෙන්වීම සඳහා ඉලක්කම් 'එකතු කරමින්' ආර්ථික පුරෝකථනයන් සකසන ලදී. මේ සංඛ්‍යා භාවිත කළ බොහෝ දෙනෙක් ඒවා සාමාන්‍ය පුරෝකථනයන්ගෙන් වෙනස් වන බව නොදැන සිටියහ. මෙබඳු අවස්ථාවලදී දළ දේශීය නිෂ්පාදනය පිළිබඳ අනාවැකි, සංකීර්ණ සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රමවේදයන් මත පදනම් නොවූවා පමණක් නොව ආර්ථිකය පිළිබඳ හොඳින් දැන්නා අයගේ ඇස්තමේන්තුවලටවත් අනුකූළ නොවීය. ඒවා IMF වැඩසටහනේම කොටසක් වශයෙන් 'කතාබහ කර ගන්නා ලද' හුදු ඉලක්කම් පමණක් විය."

**ජෝසප් ඊ. ස්ටිග්ලිට්ස්**

**'ගෝලීයකරණය හා එහි අසහනයන්' කෘතියෙනි**
(Globalization and Its Discontents)


## ආපස්සට යන රට

පසුගිය වසර 10ක් ආපසු හැරී බැලීමේදී ආර්ථික දර්ශක කිහිපයක්ම අපට පෙන්නුම් කරන්නේ ණය බර ඉදිරියට ගමන් කරමින් පොලී පැටවුන් ගසමින් ආර්ථිකයේ කටයුතු හැකිළී ගිය ආකාරයකි. 2012 සිට 2022 දක්වා මුළු වසර 10 තුළම ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය ඩොලර් 4,000 ඉක්මවා උපරිමයට පත්ව ඇත්තේ 2017 වසරේදී පමණි. එතැන් සිට 2023 දක්වාම ඇත්තේ ආර්ථිකය ආපසු ගමනකි. 2022දී ඒක පුද්ගල නිෂ්පාදනය සමාන වන්නේ 2012 ප්‍රමාණයටය. 2012-13 කාලයේදී පැවති උද්ධමනය පිළිවෙළින් 7.6% හා 6.9%කි. නමුත් එය 2022දී 63%ක් විය. 2012-13 කාලයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සඳහා පොලී අනුපාත පිළිවෙළින් 10% හා 7.5% වූ අතර 2022දී එම අගය 31.64%ක් විය. ඊට අනුරූපව බැංකුවලින් ජනතාවට ලබාදෙන ණය සඳහා අයකරන පොලියද ඉහළ අගයක් ගනු ලැබීය. එය නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීමක් වෙනුවට දුර්වල කිරීමේ ක්‍රියාමාර්ගයක් විය. ආර්ථිකයේ මුදල් ආණ්ඩුවේ අර්බුදයට පාවිච්චි කළා මිස ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදවනු නොලැබීය. 2012-13 වකවානුවේ ඒක පුද්ගල බදු බර පැවතියේ රු. 49,000ට වඩා අඩුවෙනි. එය 2022දී රු. 79,000කට වඩා ඉහළ මට්ටමකට පත්විය. ඒ අනුව 2022 වනවිට වසර 10කට කලින් ගෙවන ලද මෙන් දෙගුණයක බදු බරක් බදු ගෙවන ජනතාවට දැරීමට සිදුවිය. 2012-13 කාලයේ පැවති රාජ්‍ය ණය ප්‍රමාණයෙන් ඒක පුද්ගල ණය බර රු. 335,000ක් විය. එය 2021දී රු. ලක්ෂ 08කට ආසන්නවද 2022 වනවිට 12,40,000ක් දක්වාද ඉහළ නැගුණි. 2022 වනවිට රජයේ ණය තොගය 2012ට සාපේක්ෂව 400%කින් ඉහළ ගිය ණය බරක් විය. 2015-19 කාලය තුළදී දළ දේශීය නිෂ්පාදිතය රු. බිලියන 912කින් ඉහළ යන විට ඊට සාපේක්ෂව ණය ගැනීම එම කාලය තුළ වසරකදී සාමාන්‍යය රු. බිලියන 1108ක් ලෙස වාර්තා විය. ණය අර්බුදය ඉදිරියට යන විට දේශීය වශයෙන් රට ආපස්සට ගමන් කරන බවට ඉහත තත්වය කදිම නිදසුනකි.

## හැකිළෙන ආර්ථිකයේ අසීරු ඉලක්ක

වාර්ෂිකව ආනයන-අපනයන පරතරය පුළුල් වීම මගින් ඇතිවන වෙළඳ ශේෂ අර්බුදය හමුවේ විදේශ විනිමය අර්බුදය තවත් අසීරු අඩියකට ඇද වැටුණු අතර නැවත ණය ගැනීමේ හැකියාව දුර්වල වීමේ ප්‍රතිඵල ලෙස ඩොලර් මගින් පැවති ආර්ථික කටයුතු මේ වනවිට නතර වන මට්ටමට රටේ ආර්ථිකය අවදානමට ලක්ව ඇත. 1978දී හඳුන්වා දුන් විවෘත ආර්ථිකය මගින් ආර්ථිකයේ ප්‍රසාරණයක් සිදුවූයේ ගණිතමය වශයෙන් පමණක් බව ඊට සමාන්තරව ව්‍යුහාත්මකව කඩා වැටීමකට ලක්වූ බව දැන් සමාජයේ බොහෝ දෙනාට තේරුම් ගොස් අවසානය. නමුත් එම තේරුම් ගැනීම සිදුවන විට ලාංකේය සමාජයට බොහෝ දේ අහිමි වී ඇත. දළ දේශීය නිෂ්පාදිතය 20%කට වඩා ඉහළින් පැවති රජයේ ආදායම 2019න් පසුව 10%කට අඩු මට්ටමකට පහත වැටීමෙන්ද 1950-60 දශකයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 10%ක පැවති රාජ්‍ය ණය 2010-20 දශකයේදී 80% සිට 120% දක්වා වර්ධනය වීමෙන් මෙම අර්බුදය තුළ මූල්‍ය පද්ධතියේ සිදුවූ හැකිළීම සහ කඩා වැටීම තේරුම් ගත හැකිය. එසේම ආර්ථික කළමනාකරණයේ අසාර්ථක ප්‍රතිඵලයක් ලෙස 2020න් පසු දළ නිල විදේශ වත්කම් සංචිතද කඩා වැටුණි.

ජාත්‍යන්තර මූල්‍ය අර්බුදලේ ණය කොන්දේසි අනුව ඊළඟ ණය වාරිකයේ පංගුව ලබා ගැනීමට සුදුසුකම් ලැබීමට නම් ආණ්ඩුව ඔවුන් හඳුන්වා දී ඇති ණය ඉලක්ක සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව 2032 වසර වනවිට දැනට 128%ක් වන රාජ්‍ය ණය ප්‍රතිශතය දළ දේශීය නිෂ්පාදිතයෙන් 95%ක් දක්වා අඩුකළ යුතුය. එසේම 2027-32 කාලය තුළ දළ මූල්‍ය අවශ්‍යතාවය (ජී.එෆ්.එන්.) දළ දේශීය නිෂ්පාදිතයෙන් 13කට අඩුවෙන් පවත්වාගෙන යාම, විදේශ ණය සේවාකරණ අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයෙන් 4.5%කට පහළින් නඩත්තු කිරීම, එසේම විදේශ මූල්‍ය පරතරය 2022-2027 කාලය තුළ ඩොලර් බිලියන 16.9ක මට්ටමේ රඳවා ගැනීම එම ඉලක්කයන් වේ.



ආණ්ඩුව මෙම අසීරු ඉලක්ක සපුරා ගැනීමට උත්සාහ කරන්නේ පහසු ගණිතමය විජ්ජා මගින් මිස රටට හිතකර අභියෝග ජයග්‍රහණය කිරීමේ පැත්තෙන් නොවේ. දළ දේශීය නිෂ්පාදිතය වැඩි කිරීමෙන්ද 128%ක් වන ණය ප්‍රතිශතය අඩුකළ හැකිය. ඒ සඳහා නිෂ්පාදන ආර්ථිකය පණ ගැන්විය යුතුය. නමුත් ආණ්ඩුව දැනට සිදුකරන්නට උත්සාහ කරන්නේ ඊට පටහැණි ලෙස දේශීය හා විදේශීය වශයෙන් ලබාගෙන ඇති ණය කපාහැර ගැනීමෙන් දළ දේශීය නිෂ්පාදිතයේ ණය ප්‍රතිශතය අඩුකර ගැනීමට ක්‍රියා කිරීමයි. එහිදී විදේශ ණය බර අඩුකර ගැනීම (ප්‍රතිව්‍යුහකරණය) හිතන තරම් පහසු නැත. ඒ සඳහා භූ දේශපාලනීය ලෙස ඉටු කළ යුතු රටට අහිතකර කොන්දේසි බොහෝ ඇත. මෑත කාලයේ සිදුකළ ඛනිජ තෙල් සංස්ථාවේ තෙල් බෙදාහැරීම් පද්ධතිය විදේශ සමාගම්වලට ලබාදීම වැනි අනාගතයේ මූල්‍යමය ලෙස තක්සේරු කළ නොහැකි බොහෝ ආර්ථික අපරාධ ඒ සඳහා කළ යුතු වේ.

දේශීය බැංකු හා දේශීය වෙනත් මූල්‍ය අරමුදල් (අර්ථසාධක අරමුදල වැනි) මගින් ආණ්ඩුව ලබාගෙන ඇති ණය කපා හැරීමක් හෝ ණය තොගය අඩුකර ගැනීමක් දැනට යෝජනා කර ඇති දේශීය ණය ප්‍රතිව්‍යූහකරණය (ඩී.ඩී.ආර්.) සැලැස්මේ මූලික අරමුණ වී ඇත. මේ සියල්ල ගණිතමය ලෙස ගිණුම් මගින් සිදුකර ගන්නා මූල්‍ය වටිනාකම් හුවමාරු කරගැනීම් මිස ආර්ථිකයේ නිෂ්පාදන ක්‍රියාවලියේ සිදුවන පරිවර්තන මගින් ආර්ථිකයට ප්‍රතිලාභ අත්කර දෙන ප්‍රතිසංස්කරණ නොවේ. මහ බැංකුව ආණ්ඩුවට ලබාදී ඇති ණය භාණ්ඩාගාර බිල්පත් සඳහා ගෙවන පොලිය අඩුකර එම බිල්පත් බැඳුම්කර බවට පරිවර්තනය කිරීමෙන් ආර්ථිකයේ නිෂ්පාදන ක්‍රියාලියට කිසිදු දායකත්වයක් සැලසෙන්නේ නැති නමුත් එය මහ බැංකුවට පාඩුය. එයින් ආණ්ඩුව කෙටි කාලීනව සහනයක් ලැබුවද දේශීයව ලබාගෙන ඇති ණය තොගයේ අඩුවීමක් සිදු නොවේ. ඒ වෙනුවට භාණ්ඩාගාරයෙන් මහ බැංකුවට ලැබිය යුතු පොලී ආදායම් කොටසක් අහිමි විය. එම අහිමි වන ආදායම මහ බැංකුව පියවා ගත යුත්තේ යළි ජනතාවගේම අරමුදල් ඇති බැංකු පද්ධතිය මගිනි. එයින්ද ප්‍රමාණවත් නොවන දේශීය ණය අර්බුදයේ කොටස ආණ්ඩුව ඊළඟට පියවා ගැනීමට උත්සාහ කරන්නේ අර්ථසාධක අරමුදල් විශ්‍රාම වැටුප් අරමුදල් වැනි ජනතාවගේම අරමුදල් මගිනි. ආණ්ඩුව වෙනුවෙන් භාණ්ඩාගාරය මහජනතාවට ප්‍රතිලාභ ලබාදෙන අරමුදල් අවසානයේ භාවිතා කරන්නේ ආණ්ඩුවේ අර්බුදය විසඳා ගැනීමට මිස ජනතාව වෙනුවෙන් නොවේ.

## අභියෝගය

ආණ්ඩුව අර්බුදය ජනතාව මත පතිත කරනවා වෙනුවට ජනතාවාදී පාලනයක් පවතින තත්වය තුළ ජනතාව වෙත ඇති පීඩනය ආණ්ඩුවට බාරගත හැකිය. අද ඉහළ දමා ඇති පොලී බදු බර ගෙවා ගැනීමට නොහැකි ජනතාව එම ණය බරින් මුදා ගැනීමට ආණ්ඩුවට හැකියාව ඇත්නම් එය ආණ්ඩුවට තාවකාලික පීඩනයක් වුවද නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදී සිටින ආර්ථික කටයුතු මගින් රැකියා ජනිත කර ඇති කර්මාන්තකරුවන්ට සහ ව්‍යාපාරිකයින්ට, මූල්‍ය ක්ෂේත්‍රයේ බොහෝ දෙනෙකුට එය ආර්ථිකයේ රැඳී සිටීමට සහනයකි. එම සහනය තුළින් ඉහළ යන දේශීය නිෂ්පාදනය අපනයන ආදායම තවදුරටත් ණය ගැනීමේ අවශ්‍යතාවය අඩු කරන අතර ප්‍රතිව්‍යුහකරණය වෙනුවට එය සැබෑ ආර්ථික ප්‍රශස්තකරණයක් වනු ඇත. ආර්ථිකයේ අනාගත තිරසාර පැවැත්ම ආරක්ෂා කළ හැක්කේ එවිටය. නමුත් එවැනි තත්වයක අභියෝගාත්මක ආර්ථික ප්‍රතිසංස්කරණ ඇතිකළ හැක්කේ ජනතාවාදී පාලනයකට මිස දූෂිත දුර්වල ආණ්ඩුකරණයකට නොවේ.

> 2012-13 කාලයේ පැවති රාජ්‍ය ණය ප්‍රමාණයෙන් ඒක පුද්ගල ණය බර රු. 335,000ක් විය. එය 2021දී රු. ලක්ෂ 08කට ආසන්නවද 2022 වනවිට 12,40,000ක් දක්වාද ඉහළ නැගුණි. 2022 වනවිට රජයේ ණය තොගය 2012ට සාපේක්ෂව 400%කින් ඉහළ ගිය ණය බරක් විය. 2015-19 කාලය තුළදී දළ දේශීය නිෂ්පාදිතය රු. බිලියන 912කින් ඉහළ යන විට ඊට සාපේක්ෂව ණය ගැනීම එම කාලය තුළ වසරකදී සාමාන්‍යය රු. බිලියන 1108ක් ලෙස වාර්තා විය. ණය අර්බුදය ඉදිරියට යන විට දේශීය වශයෙන් රට ආපස්සට ගමන් කරන බවට ඉහත තත්වය කදිම නිදසුනකි.



# අපි කන හැටි ලිපා දනී...

**"ඔන්න මම මාසෙ වියදම් ටික ලිව්වා. පඩියට වැඩිය තව 50,000ක් විතර යනවා"**

විවාහයෙන් වසර 14කට පසු මාසික වියදම කොළයක සටහන් වී තිබේ. එහි ආහාර, බෙහෙත්, අධ්‍යාපන, ප්‍රවාහන හා බිල් සඳහා මුදල් දළ වශයෙන් වෙන්කර තිබුණි. නමුත් අපේ ඇඳුම් පැළඳුම් හෝ කාන්තාවක් ලෙස මගේ පෞද්ගලික සෞඛ්‍ය, රූපලාවණ්‍ය හෝ වෙනුවෙන් සත පහක්වත් එහි" නොතිබුණි.

මෙය ඔහුගේ ප්‍රශ්නයක් නොවේ. එසේ නම් මෙසේ වූයේ ඇයි? අවධානය යොමු කළ යුතු වන්නේ ඒ පිළිබඳවය. කෙසේ වෙතත් අපේ ඉතාමත් සරල ජීවන පැවැත්ම වෙනුවෙන් හෝ අපි මසකට අමතර රුපියල් 50000 මුදලක් සෙවිය යුතුව තිබේ. මේ තත්වය අපේ ගෙදරට පමණක් සීමා වූවක් ද නොවේ. රටේ ජනගහනයෙන් බහුතරයක් පවුල් අද වනවිට මුහුණ දී සිටින සැබෑ ප්‍රශ්නය මෙයයි.

ආසියා පැසිෆික් කලාපය පුරා ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති චින්තන පර්ෂදයක් වන LIRNE Asia ආයතනය මඟින් සිදුකළ සමීක්ෂණයකින් අනාවරණය වී තිබුණේ ලංකාවේ පවුල් ලක්ෂ 19ක ජීවත්වන, ලක්ෂ 79ක ජනතාව අත්‍යවශ්‍ය ආහාර මිලදී ගැනීම වෙනුවෙන් තම ගෘහ භාණ්ඩ විකුණන බවයි. රූපවාහිනී, ගුවන් විදුලි, ශීතකරණ වැනි විදුලි උපකරණවලට අමතරව ඇඳ පුටු මේස පවා විකුණන තත්වයට පත්ව ඇති බව එමඟින් හෙළි වී තිබේ.

2019 වන විට ලංකාවේ ජනගහනයෙන් මිලියන 03ක් පමණ දර්ද්‍රතාවයෙන් පෙළුණු අතර එය 2023 වන විට මිලියන 07ක් දක්වා වර්ධනය වී තිබේ. එය සමස්ත ජනගහනයෙන් 31%කි. මෙසේ දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත්වන පිරිසෙන් 81%ක්ම ජීවත්වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල වන අතර 2019 සිට 2023 දක්වා ග්‍රාමීය දරිද්‍රතාවය 15% සිට 32% දක්වා වැඩිවී ඇත. නාගරික දරිද්‍රතාවය 6% සිට 18% දක්වා තුන් ගුණයකින් ඉහළ ගොස් ඇති අතර වතු ජනතාව අතර මේ තත්වය 34% සිට 51% දක්වා වැඩි වී තිබේ. මේ මිනිස්සුන් සියලු දෙනා කුමන හෝ "දහං ගැටයක්" ගසමින් ජීවත් වීමට උත්සාහ දරති. ඒ ජීවත් වීමේ අරගලයේ ප්‍රධාන දායකත්වය දරන්නට සිදුවන්නේ පවුලක සිටින මව්වරුන්ට බව නොරහසකි. මුදල් ඉපයීම සඳහා කුමන හෝ ආකාරයක ආර්ථික කටයුත්තක නිරත වන්නට ඇයට ද හරි හරියට සිදුව තිබේ. සැමියා හම්බ කරන සොච්චමෙන් පවුලේ කටයුතු කළමනාකරණය කරන්නට සිදුවන්නේද කාන්තාවන්ටමය. ආර්ථික කඩා වැටීම මත ක්ෂුද්‍ර ආර්ථිකයට පවා කණ කොකා හඬා ඇත. මෑත කාලීනව නාගරික ප්‍රදේශවල SPA බහුලව විවෘත වන්නේත්, ග්‍රාමීය තරුණ කාන්තාවන් ඒවායේ සේවය සපයන්නන් බවට පත්වන්නේත් ඒ අනුවයි.

LIRNE Asia සමීක්ෂණ වාර්තාවට අනුව ලංකාවේ නිවාස සංඛ්‍යාවෙන් 33%ක් දිනකට ගන්නා ආහාර වේල් ගණන අඩු කර ඇති අතර පවුල් 47%ක් දිනකට ගන්නා ආහාර ප්‍රමාණය අඩු කර ඇත. එයට හේතුව තුන් වේල බඩ කට පිරෙන්නට කන්නට තරම් ප්‍රමාණවත් ආදායමක් නොමැති වීමයි. නැතිනම් ආහාර උද්ධමනය මෑත කාලීනව සීඝ්‍රයෙන් ඉහළ යාමයි. මෙම ඉහළ යෑම තුළ මස්,මාළු. බිත්තර වැනි දේ පිඟානේ ඉවතට විසි වී ගොස් ඇත. ඉතාම අපහසුවෙන් හෝ වැඩිහිටියන් නොකා නොබී තම දරුවන්ට බිත්තරයක් හෝ ලබා දීමට උත්සහ කරමින් සිටිති.වැඩි දුරටත් LIRNE Asia සමීක්ෂණ වාර්තාවේ සඳහන් වන්නේ පවුල් 27%ක වැඩිහිටියන් දරුවන්ට ආහාර ලබාදීම වෙනුවෙන් තම ආහාර වේල කැප කරන බවයි.

කෑම පමණක් නොව අනෙකුත් අවශ්‍යතා කෙතරම් නම් කපා හැර ඇත්ද? ඉඳහිටක හෝ ගිය විනෝද ගමන ගැන දැන් හිතන්නටවත් නොහැක. විනෝදාස්වාදය සඳහා චිත්‍රපටියක්, නාට්‍යයක් නැරඹීම, පොතක් මිලට ගැනීම පත්තර මිලදී ගැනීම, ඇඳුම් ගැනීම, ආදී සියලුම දේ කප්පාදු කර දමන්නට සිදුව තිබේ.

විශේෂයෙන් මේ තත්වය තුළ අවශ්‍යතා බොහෝ ප්‍රමාණයක් හකුළා ගැනීමට කාන්තාවන්ට සිදුවී තිබේ. රූපලාවණ්‍ය කටයුතු මෙන්ම ඖෂධ සඳහා කළ වියදම්ද කපා හරින්නට ඇයට සිදුව තිබේ. සියලු කුණු බේරේ වැවට මෙන් මේ සියලු ආර්ථික අගහිඟකම් වලින් වඩාත් පීඩාවට පත් වන්නේ ගෘහණියයි.

මේ පීඩනය දරාගත නොහැකිව අසරණ වෙන කාන්තාවෝ සියදිවි නසා ගන්නට පවා පෙළඹෙති. මානසික සහනය නැතිවීම, මානසික ආතතිය, ව්‍යාධිය වැනි තත්වයන් බහුලවීමද ආර්ථික අර්බුදයේ නොපෙනෙන අඳුරු පැතිවේ.

මේ සියලු හකුළා ගැනීම් සිදුකර තිබියෙදීත් නිවසේ වියදම් වෙනුවෙන් තව රුපියල් 50,000ක් පමණ අවශ්‍ය වේ. රටේ අනෙකුත් නිවාසවලද තත්වය මෙයට වඩා වෙනස් නැත. ඇඳ, පුටු මේස හෝ විකුණා කන්නට හැක්කේ කොපමණ කලකටද? ගෙදර සියලු ගෘහභාණ්ඩ විකුණා දැමූපසු විකුණන්නට කිසිවක් ඉතිරි නොවනු ඇත. රටේ තත්වයද එසේමය. විකුණා කෑමේ න්‍යායටද සීමාවක් තිබේ.

එසේ නම් කරන්නට ඉතිරිව ඇත්තේ මේ අර්බුදයේ දිග පළල ගැන අවබෝධයෙන්, එය වෙනස් කරනා මාවතක එක්ව සටන් කිරීමයි. කාන්තාවන් ලෙස අප තෝරා ගත යුත්තේ කබලෙන් ලිපට වැටීමද? ළිං කටින් ගොඩට ඒම දැයි ඔබම සිතා බලන්න.

## සතුටින් සිටිය හැකි සමාජයක් නිර්මාණය කරමු!

**නිශාන්ති වීරසේකර සහෝදරිය**
අනුරාධපුර දිස්ත්‍රික් සංවිධායිකා
-අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය-



වසර 75ක දේශපාලන ඉතිහාසය තුළ ලාංකේය ජන සමාජය විශාල ආර්ථික අර්බුදයකට ලක්කර තිබෙනවා. දරුවන් බලා ගැනීම, ගෙදර දොර නඩත්තුව, සහ ප්‍රජා වැඩ කටයුතු සිදුකර ගැනීම ඉතාමත් අසීරුයි. මේ සියලුම කටයුතුවලදී වැඩියෙන්ම පීඩාවට පත් වූයේ කාන්තාවන්. වැටුප් ලැබුණ හෝ නොලැබුණා වුවද සිල්ලම සිදුවන්නේ කාන්තාව අතින්. සමාජය තුළින් හෝ පත්වන පාලනයන් තුළින් හෝ කාන්තාව පත්වන පීඩාවන්ට මෙතෙක් කිසිදු විසඳුමක් ලැබී නැහැ. මේක ආර්ථික අර්බුදයක් පමණක් නෙවෙයි. දීර්ඝ කාලයක සිට නිර්මාණය වන සමාජ අර්බුදයක්. සමාජය කාන්තාවන්ගෙන් දරුවන් වැදීම, බලා ගැනීම, නඩත්තු කිරීම හා සමාජ ගත කිරීම වගේම මහලු දෙමාපියන් බලා ගැනීම, ගේ දොර නඩත්තුව, වැනි කාර්යයන් රැසක් බලාපොරොත්තු වෙනවා. එත් සමාජය ඇයගේ ආරක්ෂාව, සෞඛ්‍යය, ආර්ථිකය, දක්ෂතා පිළිබඳව කිසිදු අවධානයක් යොමු කරන්නෙ නැහැ.මේ කඩා වැටෙන ආර්ථිකය හමුවේ මේ තත්වය වඩාත් උග්‍ර වෙලා.

රාජ්‍ය සේවය තුළත්, පුද්ගලික අංශයේ වෙළඳ කළාප තුළත්, වතු ක්ෂේත්‍රයේත් ආර්ථික සංවර්ධනයට වැඩිම දායකත්වය දක්වන්නේ කාන්තාවන්. එහෙත් මේ ආර්ථිකය හැකිළීමේ හමුවේ වඩාත් පීඩාවට පත්වන්නේත් කාන්තාවන්.

මේ සියලුම පීඩාවන්ට විසඳුම් සෙවීම අප සතු වගකීමක්. එනිසා මේ ජරා ජීර්ණ දේශපාලන ක්‍රමය වෙනස් කර සියලු දෙනාටම සතුටින් සිටිය හැකි සමාජයක් නිර්මාණය කිරීමට අප පෙරමුණ ගත යුතුව තිබෙනවා.

ලොව පුරින්

## ඔසප් සමයට අලුත් බද්දක්..




ඝානාවේ පසුගියදා විරෝධතා ඇති වූයේ ඔසප් සමයට භාවිතා කරන කාන්තා සනීපාරක්ෂක නිෂ්පාදන මත අධික බද්දක් පැනවීමට එරට රජය ගත් තීරණයට එරෙහිවයි. මෙම විරෝධතාවය එරට සමාජවාදී ව්‍යාපාරයේ කාන්තා අංශය සහ තවත් අනුබද්ධිත සංවිධාන විසින් සංවිධානය කරන ලදී. ඝානාව මේ වන විට ඉතිහාසයේ සිට මුහුණ දුන් උග්‍රතම ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින අතර එහි පීඩනය කාන්තාවන් මත පැටවී ඇත. ඝානාවේ දේශීය බදු දෙපාර්තමේන්තුව විසින් සනීපාරක්ෂක නිෂ්පාදන "නිමි භාණ්ඩ" වර්ග ලෙස නම් කර ඇති අතර 20% බදු අයකරනු ලබයි. විරෝධතාකරුවන් රජයට බලකර සිටින්නේ සනීපාරක්ෂක නිෂ්පාදන 'අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය' ලෙස නම් කර, ඒ මත පටවා ඇති බදු ඉවත් කරන ලෙසයි.

## මරණ දඬුවමට එරෙහිව..



ඉරානයේ මාහ්සා අමිනි මිය යාමත් සමග එරට තුළ ඇති වූ අරගල රැල්ල මේ වනවිට "කාන්තාව, ජීවිතය, නිදහස" යන තේමාව ඔස්සේ තවදුරටත් වර්ධනය වෙමින් පවතී. ඉරාන රජය මෙම අරගලය කෲර ලෙස මර්දනය කළ අතර විශාල මරණ සංඛ්‍යාවක්ද, අත්ඩංගුවට ගැනීම් බොහෝමයක්ද විය. අධිකරණ ක්‍රියාවලිය තුළ විරෝධතාකරුවන් 25 කට අධික ප්‍රමාණයකට මරණ දඬුවම නියම කරන ලද අතර එයින් හත් දෙනෙකු මේ වන විටත් මරණ දඬුවමට ලක්කර ඇත. ඔවුන්ට එරෙහිව එල්ල කරන ලද චෝදනා වූයේ " දෙවියන්ට එරෙහිව යුද ප්‍රකාශ කිරීම සහ ලෝකය දූෂිත කිරීම" යනාදියයි. එසේම ඔවුන්ට නිසි නීතිඥ සහයක් ලබාගැනීමටද ඉඩලබා නොදෙන ලදි. මෙම මරණ දඬුවම්වලට එරෙහිව ලොව පුරා වාසය කරන ඉරාන ඩයස්පෝරාව විරෝධතාවය පළකරමින් සිටී.

## කාන්තා මර්දනය

සෞදි අරාබියේ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරිනියක් වන මනාහෙල් අල් ඔටායිබි 2022 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට එරට පොලිස් අත්අඩංගුවේ පසුවන්නීය. ඇය ශාරීරික යෝග්‍යතාව පිළිබඳ උපදේශකවරියකි. ඇයව මූලික වශයෙන් සිරභාරයට ගනු ලැබුවේ ඇය විසින් සෞදි අරාබියේ පවතින පුරුෂ භාරකාරත්ව නීති සහ ශරීරය සම්පූර්ණ වැසෙන සේ අබායා ඇඳුම ඇඳීමට නියම කර තිබීම සම්බන්ධව විවේචනය කරන පෝස්ටුවක් පළකිරීම හේතුවෙනි. මේ වන විට එරට නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඇයට "දේශීය සහ විදේශීය වශයෙන් රාජධානියට අපහාස කිරීමත් කැරැල්ලක් ඇති කිරීමට උත්සාහ කිරීමත්" යන චෝදනා එල්ල කරයි. Saudi Vision 2030 නමින් සකස් කර ඇති ආර්ථික සහ සමාජයීය ප්‍රතිසංස්කරණ සැලසුම තුළ කාන්තා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණත් එයට ප්‍රතිවිරුද්ධව කාන්තා ක්‍රියාකාරිනියන් මර්දනය කිරීම සෞදි අරාබිය තුළ දිගින් දිගටම සිදුවෙමින් පවතී.

# ආගම හා අන්තවාදය

ලෝකයේ බොහෝ රටවල් මෙන්ම ලංකාවද ජාතිවාදය නිසා, ආගමික අන්තවාදය නිසා විශාල ගැටුම් නිර්මාණය කරගෙන තිබේ. මෙවැනි ගැටුම් නිසා අපේ රට තුළ ගලා ගිය රුධිරය, නැතිවූ මිනිස් ජීවිත, විනාශ වූ දේපළ බොහෝය. එහෙත් තවමත් සමහර පිරිස් මෙම විනාශය හඳුනාගෙන නැති බව පෙනේ.

බලලෝභී දේශපාලන නායකයෝද, මුදල් ගැරීම අරමුණුකරගත් තක්කඩින්ද, හීන මානයෙන් පෙළෙන හා ප්‍රසිද්ධ වීමට කැමති සමහර පුද්ගලයෝද, සමහර මානසික රෝගවලින් පෙළෙන්නෝද විවිධ ආගම් අපයෝජනය කරන බව අතීතය මෙන්ම වර්තමානයද හොඳින් හදාරන විට පෙනේ.

**ආගමේ පදනම විශ්වාසය වූ කල**

මෙම ලිපියේ අරමුණ ආගම් හරිද වැරදිද යන්න සාකච්ඡා කිරීම නොවේ. බොහෝ ආගම්වල ආගමික හරයන්ට පවා එරෙහිවම එම ආගම් යොදා ගනිමින් සිදුකරන විනාශයන් පිළිබඳ සාකච්ඡා කිරීමය.


ලොව ආගම් බිහිවූයේ පරිණාමීය ක්‍රියාවලියක් තුළ මිනිසා බිහිවී මිනිස් සමාජය බිහිවීමෙන් පසුය. ආරම්භයේදී ඇදහිලි ලෙසින් පැවති දේ පසුව ආගම් බවට පත්ව තිබේ.

ආගම් නිර්මාණය වූයේ විද්‍යාව සොයාගැනීමට පෙරය. ඒ නිසාම ආගම් විද්‍යාව මෙන් තර්කනය මත නොව විශ්වාසයන් මත පදනම්ව තිබේ. තර්කනය හා අවබෝධය ගැන උගැන්වෙන බුදු දහම තුළ පවා මේ වනවිට භක්තිය හා විශ්වාසය පෙරට ගනු ලැබ ඇත.

ලෝකය පුරා විශාල ජනතාවක් තවමත් කුමන හෝ ආගමක් අදහති. ආගම් නොඅදහන අයද සැලකිය යුතු ප්‍රමාණයක් සිටිති. කෙසේ වුවද ආගම් අදහන ජනයා එය විද්‍යාව සමග සංසන්දනය කරන්නේ නැත. ඒ වෙනුවට විශ්වාසය මත ආගම් අදහති. අප ඉදිරිපිට ඇති යථාර්ථය එයයි.

**ආගමික හරයන් විකෘති කළ විට**

ලොව පුරා අප දන්නා ප්‍රධාන ආගම් බිහිව ඇත්තේ ඒ ඒ යුගවල පැවති සමාජ ආර්ථික තත්වයන් තුළ, ඒවායේ තිබූ සමහර සමාජ ගැටලුවලට විසඳුම් ලෙසය. බොහෝ ආගම් නිර්මාණය වන විට සමාජයේ පීඩාවන්ට එරෙහිව සාධාරණයේ පැත්ත ගත් බවද පෙනේ. උදාහරණ ලෙස බුදු දහම එකල ඉන්දියාවේ පැවති කුල පීඩනයට හා බ්‍රහ්ම මැවුම්වාදයට එරෙහිවිය. ක්‍රිස්තියානිය රෝම අධිරාජ්‍යයේ පීඩනයට එරෙහි විය.




එසේම ලොව බොහෝ ආගම්වල මූලික උගැන්වීම් අතර මෛත්‍රිය, කරුණාව, අසල්වැසියාට ප්‍රේමකිරීම, සහෝදරත්වය වැනි මානුෂීය ඉගැන්වීම් තිබේ. එහෙත් එවැනි පදනම් සහිත ආගම් ලේ වගුරුවන ගැටුම් සඳහා යොදා ගන්නේ කෙසේද යන්න අධ්‍යයනය කළ යුතු කාරණාවකි. විවිධ ආගම් තුළ සියලු සත්වයෝ නිදුක්වේවායි පතද්දී, මෛත්‍රිය කළ යුතුයි උගන්වද්දී, අසල්වැසියාට ප්‍රේම කිරීමට උගන්වද්දී සියලු ජනයා සහෝදරයින් බවට උගන්වද්දී එම ආගම් එකිනෙකාට එරෙහි යුද වදින තත්වයට පත්කළේ කවුරුන් විසින්ද යන්න තේරුම් ගත යුතු නොවේද?

ආගම මුදල් ඉපැයීමේ මාර්ගය කරගත් කූට පුද්ගලයන් විසින්ද, ආගම සිය පෞද්ගලික බලය හා ප්‍රසිද්ධිය සඳහා මාර්ගයක් කරගත් හීනමානයෙන් පෙළෙන මිනිසුන් විසින්ද, බොරුකාරයන්, තක්කඩින් විසින්ද ආගමේ නාමයෙන් සමාජයට කරන ලද හානිය විශාලය. එහෙත් ලොව පුරාම ජනතාවට හා සමාජයට එරෙහිව විශාලතම අපරාධයන් කර ඇත්තේ ආගම තම බලය ලබාගැනීමේ හා බලය රැකගැනීමේ මෙවලමක් බවට පත්කරගත් තක්කඩි දේශපාලකයින් විසින් බව ඉතා පැහැදිලිය.

**රජය හා ආගම**

බොහෝ ආගම් බිහිවූයේ ඒ වනවිට පැවති රාජ්‍යයන්ට පරිබාහිරව, සමහරවිට ඒවා විවේචනය කරමින් වුවත් ආගම් බිහිවීමෙන් පසු රාජ්‍යයන් විසින් ඒවා තම පාලනයට ගනු ලැබිණි. ඉක්මනින්ම රජය ආගම සමගද ආගම රජය සමගද එක් විය. ආගමේ පැවැත්ම හා ආරක්ෂාව රජය තුළින් සොයාගත් අතර රජයේ පැවැත්මට ආගම යොදා ගනු ලැබිණි.

පූර්ව ධනේශ්වර යුගයේ, වැඩවසම් හා ආසියාතික සමාජවල රජවරුන් විසින් තම රාජ්‍යත්වය තහවුරු කරගැනීමත් රාජ්‍ය පුළුල් කර ගැනීමත් සඳහා ආගම උපයෝගි කර ගෙන තිබේ. බොහෝ යටත්විජිත හිමි රටවල්, අධිරාජ්‍යයන් ලොව රටවල් ආක්‍රමණය කරනු ලැබුවේ ආගමට මුවාවී, ආගම පෙරටුකොට ගෙනය. ආගම පැතිරවීමේ නාමයෙන් කෙරෙනු යුද්ධද ඉතිහාසයේ තිබේ. ඒවා ආගම්වල මූලික උගන්වීම සමග කිසිසේත් සමපාත නොවුණද ඒවා එසේ සිදුකරන ලදී. රජයක් විසින් සිදුකරන ලද ම්ලේච්ඡ ආක්‍රමණයන්, ජන ඝාතන සාධාරණය කර ගැනීමට ආගම යොදාගෙන තිබෙන හැටි ලෝක ඉතිහාසය තුළ දැකිය හැක. ඊට අමතරව අපේ රටවල දැන් අර්බුදයට ගිය ධනවාදී ක්‍රමය තුළ ජනතාවගේ අවධානය වෙන'තක යොමුකිරීම සඳහාත්, තමන් වෙත බලය ලබා ගැනීම සඳහාත් පාලක කල්ලි ජාතිවාදය හා ආගමික අන්තවාදය යොදා ගනිමින් සිටිති. එය වඩාත් භයානකය. පිළිකුල් සහගතය.

**ආගමික අන්තවාදය හා පාලක කල්ලි**

ලංකාවේද ධනේශ්වර ඉතිහාසය තුළ පාලක කල්ලි බලය ලබා ගැනීමේ පහසු මඟ ලෙස තෝරාගන්නා ලද්දේ ආගම හා ජාතියය. මෙහිදී විශේෂයෙන් ලංකාවේ බහුතර ජනයා බෞද්ධ වීම නිසා දේශපාලකයින්ද බෞද්ධ වෙස් ගන්නා ලදී. තමන්ගේ පරපුර කලින් ඇදහූ ආගම වෙනස් කර බෞද්ධ ලෙසත් යුරෝපීය ඇඳුම වෙනස් කර ජාතික ඇඳුමටත් මාරු වූ දේශපාලකයන් පිළිබඳ අපේ රටේ ඉතිහාසය තුළ අපි දනිමු. එතෙන් සිට ඔවුහු සිංහල බෞද්ධ ඡන්ද සඳහා මෙලෙස වෙස්මාරුකරගත් අතර ආගමික අන්තවාදයත් පෝෂණය කරමින් ජනතාව අතර ගැටුම් ඇවිළවීමද කළෝය.

කලක් සිංහල දෙමළ ජාතිවාදය අවුළුවා ඒ මතින් බලය තහවුරු කර ගත් පාලකයෝ පසුව ආගමික ගැටුම් නිර්මාණය කොට ජනතාව බිය වැද්දවීමේ කුමන්ත්‍රණද සැලසුම් කළහ. 2019 ගෝඨාභය රාජපක්ෂ බලයට ගෙන ඒම සඳහා මඟ සකස් කළ මුස්ලිම් විරෝධය ඊට හොඳම උදාහරණයකි. එහි උච්ඡතම අවස්ථාව වූයේ, වඳ දොස්තර කථාව හා පාස්කු ප්‍රහාරය වේ. එහෙත් දැන් හෙළි වී ඇත්තේ කුමක්ද? වඳ දොස්තර ලෙස නම් කළ වෛද්‍යවරයා චෝදනාවලින් නිදහස් වී යළි සේවය කිරීමත්, පාස්කු ප්‍රහාරය ආණ්ඩුවේ සැලසුම් මත සිදුවූ ප්‍රහාරයක් ලෙස සැක කිරීමත්ය. එසේම පාස්කු ප්‍රහාරයට වගකිවයුතු සහරාන් කණ්ඩායමට මෙන්ම අන්තවාදී බෞද්ධ සංවිධානයකට එකම ගිණුමකින් මුදල්දී ඇති බවද පසුව හෙළිදරව් විය.

බලය පිළිබඳ ප්‍රශ්නයේදී පාලකයින් මොනතරම් කුරිරුද යන්න ඉන් හෙළිවේ. එක් ආගමික අන්තවාදයක් ආණ්ඩුව විසින් පෝෂණය කරන විට ඊට සමගාමීවම අනෙක් ආගම් තුළද අන්තවාදය නිර්මාණය වන අතර සමහරවිට මේ දෙපැත්තම පෝෂණය කිරීම ධනපති පාලකයින් විසින් කරනු අවස්ථා ඕනෑතරම් තිබේ.

**බංකොලොත් බව වසා ගැනීම**

පාලකයන් ජාතිවාදයේ හා ආගමික අන්තවාදයේ පිහිට පතන්නේ බලය සඳහා වෙනත් මඟක් නැතිවූ විට හා පහසු මඟ එය වන විටය. මේ වනවිටද අපේ රටත් ජනතාවත් ඉදිරියේ මෙම අනතුර යළි මතුව තිබේ. ආර්ථික වශයෙන් බංකොලාත් කළ රටක, ඉන් ජනතාව පීඩාවට පත්ව පාලකයන්ට එරෙහිව වීදි බසිමින් විරෝධය පළකරන රටක, දැන් බොරු ආර්ථික සංවර්ධන, සංදර්ශන පෙන්වා බලය රැක ගැනීමට ධනපති පාලකයින්ට නොහැක. විශේෂයෙන්ම ජනතාව වමේ ප්‍රගතිශීලී දේශපාලන ව්‍යාපාරය වෙත විශ්වාසය තබන විට ධනපති පාලක කණ්ඩායම් වඩාත් බියට පත්වේ. එවිට ඔවුන් සතුව ඇති එකම හා අවසාන තුරුම්පුව වන්නේ ආගමික අන්තවාදය මතින් ජනතාව අතර ආගමික ගැටුමක් නිර්මාණය කර ඒ මගින් බලය තහවුරු කර ගැනීමට මාන බැලීමය.

එබැවින් යළිත් එවැනි කුමන්ත්‍රණයකට, එවැනි ගැටුමකට ඉඩ නොතබා, ආගම් ඇදහීම හා ආගමික අන්තවාදය අතර වෙනස වටහාගෙන සිහි නුවණින් කටයුතු කිරීම මෙම සියලු පුරවැසියන්ගේ වගකීම වේ.



"දේශපාලනයේදී ජනතාව හැමදාමත් රැවටිල්ලට හා ආත්ම රැවටිල්ලට අඥාන ලෙස ගොදුරු වී ඇත. එමෙන්ම, සියලුම සදාචාර, ආගමික, දේශපාලන හා සමාජ වදන්, ප්‍රකාශයන් හා පොරොන්දු පිටුපස තිබෙන කිසියම් එක් හෝ අනෙක් පංතියක වුවමනාවන් සොයා, තෝරා ගැනීමට ඔවුන් උගෙන ගන්නා තෙක්ම ඔවුන් එසේ තවදුරටත් රැවටෙනු ඇත."

**ලෙනින්**

**තෝරාගත් කෘති, 1 වැනි වෙළුම, 52 පිටුව**

# පොලිටිකල් පංතිය

පොලිටික්ක හැමදාම වගේ උදේම වගේ පංතියට ආවට මූණ හරි නෑ. ලොකු ප්‍රශ්නයක් බව මූණෙන්ම පේනව. ප්‍රශ්නෙ ඩබල් වෙයිද දන්නෙ නැති හින්ද කවුරුත් අහන්න ගියේ නෑ... කීපදෙනෙක්ගෙ කටට ඇවිත් තිබුණත් නොකර සද්ද මඟහැරල ගියා.

"ගුඩ් මෝනිං සර්" වසන්තිය... "වෙරි ගුඩ් මෝනිං සර්" අනුරුද්දිය යන්ත්‍ර වගේ කියාගෙන යනව. පොලිටික්ක "ආයුබෝවන් ළමයිනේ කියනවා" ඔහොම තමයි ගත වුණේ.

"ඔය ළමයි මොනවද සහනාධාර ගැන හිතන්නෙ?" දවසක් පංති පටන් ගන්න කලින් පොලිටික්ක ළමයින්ගෙන් ඇහුව.

"සහනාධාර දෙන්න වෙනවනෙ, ලංකාවෙ තියෙන තත්වෙ හැටියට..., සහනාධාර දුන්නෙත් දේශපාලනේට... කපන්නෙත් දේශපාලනේට..., නිකම්ම දීල තේරුමකුත් නෑ... ගොඩගන්න වැඩපිළිවෙළක් නැතුව..., දැන්නම් සියයට 90කට විතර දෙන්න වෙනවා..." පංතියෙන් එක එක කතා මතු වුණා.

"සර්ටත් සහනාධාර ලැබෙන්න ඕනැ තත්වයක් ඇවිල්ලද?" මංජුව වටේ යන එක අඩුකරන්න බලාගෙන ඇහුවා.

"නෑ... නෑ... මට ප්‍රශ්නයක් නෑ. මම කවදාවත් අරගෙනත් නෑ... ගන්න බලාපොරොත්තුවකුත් නෑ" පොලිටික්ක පරසක්වළ ගහනව.

"ඒ වුණාට සර් මේ දවස්වල ඉන්නෙ ලොකු ප්‍රශ්නෙක... මූණෙන් පේනව. සල්ලි ප්‍රශ්නයක්ද?" කනිය කවුරුත් ඇහුවෙ නැති ප්‍රශ්නෙ දමල ගැහැව්ව.

"ප්‍රශ්න නැත්තෙ කාටද ළමයිනේ... ඒත් මට තියෙන්නෙ සහනාධාර ප්‍රශ්නයක් නෙමෙයි, මගෙන් ඉල්ලන ප්‍රශ්නයක්" පොලිටික්කගෙ කතාව තේරෙන්න වෙලා ගියා.

"සර්ගෙන් සහනාධාර ඉල්ලන්නෙ කවුද සර්? පඩියක් ගන්න කෙනෙක්ගෙන්..." සමන පොලිටික්ක දිහා බලද්දි පොලිටික්ක ඇඟට ඇළුණු කමිස සාක්කුව අතගෑව.

"මිනිස්සුන්ට පිස්සුද සර්... සර්ගෙන් සහනාධාර ඉල්ලන්න" මංජුව ආයෙත් කමිස අත නමනව... ගහන්න වගෙ.

"ඇත්තටම ඇයි සර්ගෙන් ඉල්ලන්නෙ?" කනිය කොණහනව.

"අනේ මං දන්නෙ නෑ. බේරෙන්න බෑ... අස්වැසුම කපලලු... හදල දෙන්නලු" පොලිටික්ක ජනේලෙන් එළිය බැලුවෙ මෙහෙටත් ඇවිල්ලද කියල.

"ඉතින් ඇයි සර්ගෙන් ඉල්ලන්නෙ? සර් නෙමෙයිනෙ කැපුවෙ... ආණ්ඩුවනෙ කපල තියෙන්නෙ... සර්ගෙ මොකද්ද සම්බන්දෙ?" සමන පොලිටික්ක බිත්තියටම හේත්තු කළා.

"මම කැපුව දෙයක් නෑ ළමයිනේ. මම ඒ කලෙ සමහරුන්ට අරන් දුන්න. දැන් කියනව... කපල තියෙන්නෙත් මමලු" පොලිටික්ක නිදහසට කරුණු කියනව.

"ඉතින් සර්වම අල්ල ගන්නෙ ඇයි?" මංජුව හදිසි මරණ පරීක්ෂක වගේ හේතුව එළියට අදිනව.

"මම පහුගිය කාලෙ ගෙවල්වලට ගොඩවෙද්දි කිව්වනෙ ඔයාලා දැන් සෑහෙන්න දියුණු වෙලානෙ කියල. ඒක තමයි නරකෙට හිටියෙ. එයලා හිතනව මම තමයි කපන්න ඇත්තෙ කියල" පොලිටික්ක විස්සෝපෙන්.

"ඉතින් සර්ට කියන්න පුළුවන්නෙ මම නෙමෙයි කපල තියෙන්නෙ ආණ්ඩුවෙන් කියන්න... ආණ්ඩුවත් එක්ක බලාගන්න කියන්න" කනිය නිදහස කරුණු පංතියක් දාල.

"එහෙම කියන්න එපාලු. මම පොහොට්ටුවෙ අපේක්ෂකයෙක්ලු. පොහොට්ටුව රනිල්ට උදව් කරනවලු. ඒ කියන්නෙ මම ආණ්ඩුවෙලු. හදල දෙන්න ඕනැත් මමලු. ඉතින් කියන්නෙ කාටද?" පොලිටික්කට ඇඬෙන්න වගේ... අතට ගත්ත කෑම එක කන්න නෑ... එළියට බහින්න බෑ... හැම තැනම නඩු"

"සර්ටත් හොඳ වැඩේ... රනිල්ව ගොඩදාන්න ගිහින් සර්ලට ඇදගෙන නාන්න වෙලා... පොහොට්ටුවෙ හැමෝටම වෙලා තියෙන්නෙ ඕක..." සමන පොලිටික්කගෙ ඇස් දිහා නොබලම කිවුවෙ පොලිටික්කට කඳුළු පනී කියල.

## කවුළුව හැරී තබමි

# 'අපේ මිනිසා'



ජූලි මාසය ලාංකේය සමාජයට බොහෝ අමිහිරි මතකයන් එක්කළ මාසයකි. ඒ අමිහිරි මෙන්ම සැබෑ "මිනිස්" මිහිරක්ද එක්කළ මාසයකි. ජූලි මාසය ලාංකේය ඉතිහාසය බිහිකළ සැබෑ මිනිස් සටන්කරුවා, සැබෑ වෘත්තීය විප්ලවවාදියා බිහි කළේද එම ජූලි මාසයයි. දිනය බැස්ටිලය බිඳ දැමූ ඓතිහාසික 14 වැනිදායි. ඔහු නමින් අපි කවුරුත් දන්නා හඳුන්වන පරිදි රෝහණ විජේවීර සහෝදරයායි. එතෙක් සනීභූත වූ ශ්‍රී ලාංකේය සමාජය ඇත්ත මිනිස් අරුතකින් ප්‍රශ්න කළේද මෙරට ඉතිහාසය මිනිස් අරුතකින් වෙනස් කිරීම සඳහා දිවිපරදුවට තබා සටන් වැදි පළමු මිනිසාද ඔහුය.

මිනිස් දැනුම කිසි දිනෙකවත් සර්වඥතාවයේ ලක්ෂණය හිමි නොකර ගන්නා බවද මේ සමාජය මේ නරා දුකෙන් ගලවා ගැනීමට සර්වඥතාවය සහිත තනි පුද්ගලයෙකු කිසිදා පහළ නොවන බවද එය සාමූහික මිනිස් ක්‍රියාකාරිත්වයකින්ම කළ යුතු වැඩක් බවද දියුණු සහ තියුණු දේශපාලන දෘෂ්ටියකින් ලාංකේය සමාජයට ඒත්තු ගැන්වීමට මුල පිරූ මිනිස් විප්ලවවාදියා වූයේද රෝහණ විජේවීර සහෝදරයාය. ඔහු පංතිමය මිනිසෙකි. ඔහු නිතරම සටන් කළේ, කතා කළේ භාවිතයේ යෙදුණේ පංතිමය අරුතකිනි.

පරමාදර්ශ යනු ආගමික විශ්වාස බව ඔහු තරයේ වටහාගෙන සිටියේය. එනිසා ඔහු අපිට පරමාදර්ශයක් නොව දියුණු දේශපාලන ආදර්ශයක් පමණි. ඔහුට කළ හැකි ඉහළම ගෞරවයද ඔහුව එලෙස වටහා ගැනීමය.

# නාමල් බේබි හදිසියේම 'මාක්ස්වාදියෙකු' වෙයි!

"මම හැමදාමත් කම්කරුවන්ගේ අයිතිය වෙනුවෙන් පෙනී ඉන්නවා. වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරනවා"

පසුගියදා වෘත්තිය සමිති නායකයින් යැයි කියාගත් පොහොට්ටුවාදී හෙංචයියන් තිදෙනෙකු ඉදිරියේ තබාගෙන ඉහත ප්‍රකාශය කර තිබුණේ හිටපු ජනාධිපති මහින්දගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර රත්නය නාමල් බේබිය.

මේ පුතාණෝ මෙසේ කියන්නේ තමන්ද ඇතුළු තම පියාණෝද ඥාති ජනයාද ඇතුළුව රනිල් -රාජපක්ෂ ආණ්ඩුව රටේ කම්කරු ජනතාවගේ ඊපීඑෆ් - ඊටීඑෆ් අරමුදල්වලටද ලොකුම කෙළිය කෙළවන ගමන්ය.

මේ රටේ වැඩකරන ජනතාවට කෙළවුණු කෙළවිලි මොහොතකට පැත්තක තියමු. ඒ අහිංසකයන් ජීවිත කඹුරා උපයාගත් එමෙන්ම විශ්‍රාම දිවියේදී ලෙවකකා හෝ ජීවත්වීමට තිබෙන ඔවුන්ගේම දහඩිය මහන්සියෙන් උපයාගත් ඒ අරමුදලත් කොල්ලකමින් තම මඩි තරකර ගන්නා රනිල් -රාජපක්ෂලාගේ පුත්‍රයා අර වගේ කතාවක් කියන විට ඔහු ඉදිරිපිට සිට ඒ කතාව අහන අර කම්කරු නායකයින් තිදෙනා වස්ත්‍ර ඇඳගෙන සිටියේ කුමකටදැයි පැන නගින බරපතළම ගැටලුවයි.



මළවුන් සමග කතාකරන කට්ටඩියෙකු අපට මෙහිදි සිහිවේ. නාමල් ඉදිරියේ වාඩිගෙන සිටියේ මළ මිනිසුන් තිදෙනෙකු නොවේ නම්, මේ ඒ තක්කඩියාගේ ඉරණම එසැණින්ම ඔවුන් තීන්දු කරනු ඇත.

වැරදිකරුවා, වාසිය පිණිස බොරුවට රඟපාන තක්කඩියා නොව එය ඇත්ත යැයි පිළිගන්නා මෝඩයාය.

# ඊළඟ ජූලිය සුදු කරමු



ජූලි මාසය ලාංකේය ඉතිහාසයට කළු පැල්ලම් ගණනාවක් එකකළ මාසයක් බව අපි කලින් සටහනින් කීවෙමු. ජූලි මාසය හා ඒ කළු පැල්ලම් අතර 83 කළු ජූලිය කිසිදා මෙරට ඉතිහාසයෙන් මැකිය නොහැකි කළු පැල්ලමකි.

1983 එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් බිම්බෝම්බයක් අටවා ශ්‍රී ලංකා යුද හමුදාවේ භටයන් 13ක් ඝාතනය කිරීමෙන් මෙන්ම ඔවුන්ගේ මළ සිරුරු භූමදානය කිරීම සඳහා බොරැල්ල කනත්තට ගෙන ඒමත් සමගම මෙම කළු ජූලිය නිර්මාණය විය. එය නිර්මාණය වූවාට වඩා එදා ජේ.ආර්. ප්‍රමුඛ පාලක නඩය එය නිර්මාණය කළා යයි කීවොත් එය වඩා නිවැරදිය.

ජාතිවාදයත් ආගම්වාදයත් අපේ රටේ පාලකයන්ගේ අගසව් දෙනමය. ඉතිහාසයේ සෑම මිනිස් ප්‍රශ්නයක්ම යට ගැසීම සඳහා අපේ රටේ පාලකයින් වේදිකාවට කැඳෙව්වේ මේ අගසව් දෙනමය. එය අදටත් එසේමය. ජාතිවාදය සහ ආගම්වාදය සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ප්‍රතිගාමී දේශපාලන නායකයන්ගේ තියුණුම දේශපාලන අවි දෙකය. මේ ම්ලේච්ඡ අවි දෙකෙන් ඔවුන් නිරායුද කළ හැක්කේද සිංහල, දෙමළ, මුස්ලිම් පොදු ජනයාටමය. ඒ සඳහා ඔවුන් හිතන මතන ජනතාවක් බවට පත්කිරීමේ දේශපාලනය තීරණාත්මකය.

2023 ජුනි 23

# දේශීය ව්‍යවසායකයා මුහුණ දී තිබෙන ගැටලුවලට ඉක්මන් පිළියම් අවශ්‍යයි

මේ අර්බුදයට වගකිව යුතු කිසිවෙක් මේ අර්බුදයේ ප්‍රතිවිපාක විඳින්නේ නැහැ. මේ අර්බුදයට වංචා, දූෂණ, නාස්ති හේතු වුණා නම්, ඒ මගින් ධනය එක්රැස් කර ගත් කණ්ඩායම් මේ ව්‍යසනයේ ගොදුරු බවට පත්වෙලා නැහැ. ඒ වාගේම මේ අර්බුදය නිර්මාණය වෙන්න තීන්දු තීරණ ගත්ත පී.බී. ජයසුන්දර, කබ්රාල්, බැසිල් ඇතුළු නඩය හිටියා නම්, ඒ නඩයත් මේ අර්බුදයෙන් ව්‍යසනයට පත් වෙච්ච නැති කණ්ඩායමක් හොයා ගන්න නැහැ කියලා කියාවි. හැබැයි, ඉතා පැහැදිලි කණ්ඩායමක් ඉන්නවා, මේ අර්බුදයෙන් ව්‍යසනයට පත් නොවුණු. අද මේ අර්බුදයේ ගොදුරු බවට පත්වෙලා තිබෙන්නේ එයට වගකිව යුතු අය නොවෙයි.

ව්‍යවසායකයන් මුහුණ දෙන ප්‍රශ්නය මොකක්ද බලන්න. ප්‍රධාන වශයෙන් අපට දේශීය නිෂ්පාදකයින් ගන්න පුළුවන්. ඒ ගොල්ලන් ඇඟලුම් නිෂ්පාදනය කරන අය, කුඩා භාණ්ඩ නිෂ්පාදනය කරලා විදෙස් වෙළඳපොළට අපනයනය කරන අය, දේශීය වෙළඳපොළට කුඩා භාණ්ඩ නිෂ්පාදනය කරන අය වෙන්න පුළුවන්. ඒ වාගේම සංචාරක කර්මාන්තයේ යෙදෙන ව්‍යවසායකයන්, ඉදිකිරීම් කර්මාන්තයේ යෙදෙන ව්‍යවසායකයන් වෙන්න පුළුවන්. කර්මාන්තශාලාවක් දැවැන්ත නිෂ්පාදනයකට අත තබන්නේ බොහොම කුඩා ප්‍රමාණයෙන් කියලා අපි දන්නවා. ඒ ගොල්ලන්ගේ දැනුම, හැකියාව, කැප කිරීම, මහන්සියේ ප්‍රතිඵලයක් හැටියට තමයි ව්‍යාපාර මේ දක්වා වර්ධනය කර ගෙන තිබෙන්නේ. මේවා. දශක එකහමාර, දෙක තුන ආදී වශයෙන් දීර්ඝ කාලයක් තිස්සේ විශාල වෙහෙසක් දරලා ගොඩනඟපු ව්‍යාපාර, ඒ ව්‍යාපාර බිඳ වැටුණොත්, නැවත ආරම්භ කරන්න බැහැ. ඒ නිසා අපේ රටේ ආර්ථිකය යම් ප්‍රකෘතිභාවයකට ගෙනෙනවා නම්, අනිවාර්යයෙන්ම ඒ ව්‍යාපාර තිබුණු තත්වයෙන්වත් පවත්වාගෙන යාම සඳහා අපි කටයුතු කළ යුතුයි.

එය ව්‍යවසායකයාගේ පෞද්ගලික ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් නොවෙයි. ඇඟලුම් කර්මාන්තයේ යෙදෙන ව්‍යවසායකයෙක්, ඉදිකිරීම් කර්මාන්තයේ යෙදෙන කර්මාන්තකරුවෙක් ආරක්ෂා කර ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් නොවයි. සමස්ත රටේ ආර්ථිකය ආරක්ෂා කර ගන්න නම්, යළි ආර්ථිකයේ ප්‍රකෘති තත්වයක් එනකොට ඒ ක්ෂේත්‍රවල සිටින ඔවුන්ට ඒ ඇන්ජිම පණ පොවන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. හැබැයි, දැන් ඒ ක්ෂේත්‍ර මුහුණ දෙන ප්‍රශ්න දිහා බලපුවාම, ආර්ථිකයේ යම් ප්‍රකෘතිමය තත්වයක් ආවත්, ඒ බිඳ වැටුණු කර්මාන්ත නැවත පණ පොවන්න බැරි අර්බුදයකට මුහුණ දෙමින් තිබෙන බව අපට පැහැදිලියි. ඔවුන්ගේ ප්‍රධානම ඉල්ලීම බවට පත්වී තිබෙන්නේ, එම කර්මාන්ත නැවත පණ ගැන්වීම සඳහා අවශ්‍ය අවම තත්වයෙන්වත් ඒ කර්මාන්ත ආරක්ෂා කර ගත යුතුයි කියලායි.

සංචාරක කර්මාන්තයේ යෙදෙන කෙනෙක් වාහනයක් ලීසිං කරලා අරගෙන තිබෙනවා නම්, ඒ වාහනය ලීසිං සමාගම් විසින් පැහැරගෙන යනවා නම්, වාහන අයිතිකරුට මොකක්ද වෙන්නේ? කිසිම නීතියකට යටත් නොවෙන, අතිශය බලපෑම් සහගතව, චණ්ඩිකම් මගින් මේ ලීසිං වාහන පැහැර ගැනීම සිද්ධ වෙනවා. ඔහුගේ කර්මාන්තයේ තිබෙන මූලිකම දේ තමයි තමන් සතුව තිබූ වාහනය. එම වාහනය පැහැර ගෙන යන්න අපි ඉඩ දෙනවා නම්, ඔහු ඒ කර්මාන්තයට පණ පොවන්නේ කොහොමද? ඒ නිසා මේ පැහැර ගැනීම් නතර කළ යුතුයි. මේ කියන්නේ වෙන මොකුත් නොවෙයි. එම ව්‍යවසායකයා නැවත තමන්ගේ ව්‍යාපාරයට පණ පොවන්න නම් ඒ වාහනය පැහැරගෙන ගියාම, කොහොමද ඒ ව්‍යවසායකයා නැවත ඒ ව්‍යාපාරයට පණ පොවන්නේ? ඒ නිසා නිශ්චිත තීන්දු ගත යුතුයි කියලා මම හිතනවා.

දෙවැනි තීන්දුවත් ඒ හා සමානයි. බොහෝ ව්‍යවසායකයින් බැංකු සමග යම් එකඟතාවයකට ඇවිල්ලා ගත් ණය මුදල්වලින් තමයි මේ ව්‍යාපාර ආරම්භ කරලා තිබෙන්නේ. එතකොට ඒ ව්‍යවසායකයා පැති දෙකකට මුහුණ දෙනවා. එක පැත්තක් මොකක්ද? ගනු ලැබූ ආර්ථික ප්‍රතිපත්තීන් හේතුකොට ගෙන තමන් අපේක්ෂා කරන ලද මට්ටමට තමන්ගේ ව්‍යාපාරය පවත්වාගෙන යන්න බැරි වෙනවා. තවත් පැත්තක් තමයි. පාස්කු ප්‍රහාරයත් යම් ප්‍රමාණයකින් එයට බලපෑවා; කොවිඩ් - 19 වසංගතයත් යම් ප්‍රමාණයකට බලපෑවා. ප්‍රධාන වශයෙන් ගත්තොත්, ආර්ථික ප්‍රතිපත්තීන් බලපෑවා. ඒ නිසා තමන් අපේක්ෂා කරන ලද ආදායම එම ව්‍යාපාරයට නොලැබෙන තත්වයක් තිබෙනවා. එතකොට මොකද වෙන්නේ? තමන්ගේ වාහනයට අදාළ වාරිකය ගෙවාගන්න බැරි තත්වය, ස්වාභාවික තත්වයක්. ඒකට හේතු කිහිපයක් තිබෙනවා.

එකක්, නන්දලාල් වීරසිංහ මහ බැංකු අධිපතිවරයාගේ ආර්ථික ප්‍රතිපත්තිය තුළින් මුළුමනින්ම ආර්ථික හැකිළවීම. ඒ නිසා ගිය අවුරුද්දේ අපේ ආර්ථික වර්ධන වේගය සියයට ඍණ 7.8යි. ඒ කියන්නේ, 2021ට සාපේක්ෂව ආර්ථිකය සියයට ඍණ7.8කින් හැකිළෙනවා. මේ අවුරුද්දේ අපේ ආර්ථික වර්ධන වේගය ගත්තොත්, ගිය අවුරුද්දේ හැකිළුණු ප්‍රමාණයට තව ඍණ 3ක් එකතු වෙනවා කියලා. IMF එක කියනවා. ලෝක බැංකුව කියනවා, ඍණ 4.2යි කියලා. මුළු ආර්ථික උපායමාර්ගයම සකස් කරලා තිබෙන්නේ ආර්ථිකය හැකිළීම සඳහා නම්, වෙළෙඳපොළ හැකිළෙන එක වළක්වන්න බැහැ. නිෂ්පාදන සඳහා තමන් ඉලක්කගත කරලා තිබෙන ඉල්ලුම ලැබෙන්නේ නැහැ. ඒක ව්‍යවසායකයන්ට බලපෑවා.

ඊළඟ හේතුව මෙයයි, ව්‍යාපාරයක් ආරම්භ කරනකොට ව්‍යවසායකයා දන්නවා තමන් මේ ආරම්භ කරන ව්‍යාපාරයට මේ පොලී අනුපාතයට මසකට ලබා දිය යුතු වාරිකය මෙච්චරයි කියලා. ඕනෑම business plan එකක් හදන්නේ, අවුරුද්දක් හෝ දෙකක් මම මාසිකව ගෙවන්න ඕනෑ වාරිකය මෙච්චර ප්‍රමාණයයි, ඒ වාරිකය මට මේ ව්‍යාපාරයෙන් උපයා ගැනීමේ හැකියාවක් තිබෙනවා කියලා. හැබැයි හිටි හැටියේ සියයට 14ට, 15ට, තිබුණු පොලී අනුපාතිකය සියයට 30, 32 වනකොට කොහොමද ඒ වාරිකය ගෙවන්නේ? ඒ වාරිකය ගෙවීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. සියයට 30 පොලී අනුපාතිකයට ණය මුදලක් අරගෙන ව්‍යාපාරයක් ආරම්භ කරලා මේ රටේ ලාභ ලබන්න පුළුවන් නම්, මම හිතන්නේ එහෙම ලාභයක් ලබන්න පුළුවන් එකම ව්‍යාපාරය කුඩු ව්‍යාපාරය කියලා. ඒ නිසා තමන් ගෙවිය යුතු පොලියට වඩා අධික පොලියක් ගෙවන්න සිද්ධ වෙනවා.



ජාතික ජන බලවේගයේ නායක,
පාර්ලිමේන්තු මන්ත්‍රී
අනුර කුමාර දිසානායක සහෝදරයා

තුන්වන හේතුව මෙයයි. තමන්ගේ නිෂ්පාදන සඳහා යන පිරිවැය වෙනදාට වඩා වැඩි වෙන්න පටන් ගත්තා. විදුලි බිල ඉහළ ගියා. ඩොලරයේ අගය ඉහළ ගියා. අමුද්‍රව්‍ය ආනයන වියදම ඉහළ ගියා. ඒ නිසා මොකද වුණේ? වෙනදාට තමන්ට භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා යන පිරිවැයට වඩා වැඩි පිරිවැයක් ඒ අයට දරන්න සිද්ධ වුණා. ඒ නිසාත් තමන්ගේ බැංකු වාරිකය ගෙවා ගන්න බැරි තත්වයක් ඇති වුණා. ඉතාම මහන්සියෙන්, දැක්මක් සහිතව දේශීය ව්‍යවසායකයෙක් හැටියට ගොඩනැගුණු කෙනාට මේ ආණ්ඩුව විසින් ඇති කරන ලද අර්බුදයේ ප්‍රතිඵලයක් විධියට තමයි අද බැංකුවට තමන්ගේ වාරික ගෙවා ගන්න බැරි තත්වයක් ඇති වී තිබෙන්නේ. දැන් අපි මොකද කරන්නේ ඕනෑ? දැන් අපට කරන්න තිබෙන්නේ, ඒ ව්‍යාපාරය බැංකුවට සින්න වෙන්න දෙන එකද? බැංකුවට වෙන්දේසි කරන්න ඉඩ දෙන එකද? දැන් මොකක්ද සිදුවී තිබෙන්නේ? ඒ ව්‍යාපාර සංගම් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවල තිබෙනවා. මේ අවුරුද්දේ පළමු කාර්තුවේ විතරක් ව්‍යාපාර හාරසියයකට ආසන්න ප්‍රමාණයක් වෙන්දේසියට යොමු කිරීම සඳහා parate නීතිය යටතේ පවරාගෙන තිබෙනවා කියලා. දැන් මම අහන්නේ, මේ ආර්ථිකයට නැවත ප්‍රකෘත්තියක් දෙන්න පුළුවන්ද? බැංකු වාර්ක කිහිපයක් ගෙවීම අත්හිටුවීම හේතුකොටගෙන කරමින් තිබුණු ව්‍යාපාරය වෙන්දේසි කිරීමට භාජන වෙනවා නම්, නැවත කොහොමද ව්‍යාපාරයකට පණ පොවන්නේ? බැංකු ව්‍යාපාර කරන්නද යන්නේ? ඒ නිසා අපි නිශ්චිත තීන්දුවක් ගත යුතුයි. මේ parate නීතිය හරහා ව්‍යාපාර පවරා ගැනීම අත්හිටුවීම සඳහා කටයුතු කරන්න ඕනෑ. මේ නිශ්චිත මොහොතේ පවරා ගැනීමක් සිද්ධ වෙනවා නම්, එය ව්‍යවසායකයා කරපු වරදක් නොවෙයි. ඇති වී තිබෙන ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් හැටියට ඔහුට ඒ වාරික ගෙවා ගන්න බැරි වෙනවා. ඊට වගකියන්න ඕනෑ ඔහු නොවෙයි. ඒ නිසා මේ පිළිබඳව වහාම ඉක්මන් තීන්දුවක් ගත යුතුයි.

ඊළඟට, අපි කවුරුත් දන්නවා දැන් ක්‍රමානුකූලව අපේ ආනයන ලිහිල් කිරීම සඳහා සැලසුම් හදා තිබෙන බව. විශේෂයෙන්ම අපේ දේශීය ඇඟලුම් නිෂ්පාදකයන් විශාල වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. සාමාන්‍යයෙන් අපේ රටේ රෙදිපිළි නිෂ්පාදනයෙන් සියයට 80ක් පමණ දේශීය ඇඟලුම් නිෂ්පාදකයන් විසින් සපයනු ලබන තත්වයකට ඇවිල්ලා තිබෙනවා. ඒක හොඳ තත්වයක්. අර්බුදය නිසා අපට වෙළඳපොළ වහන්න සිදුවුණා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට අපේ දේශීය කර්මාන්තවල යම් වර්ධනයක් අත්පත් වී තිබෙනවා. දැන් අපි මොකද කරන්න ඕනෑ? දැන් අපි දේශීය කර්මාන්තවල ඇති වී තිබෙන මේ වර්ධනය ආරක්ෂා කර ගැනීම සඳහා උපායමාර්ගය සකස් කරමින් තමයි ආනයන සීමා ලිහිල් කරන්න ඕනෑ. නමුත් දැනට අපට ලැබෙන වාර්තා අනුව බැලුවාම, මේ ආනයන සීමා ඉවත් කළොත්, දැනට අපි වර්ධනය කර ගනිමින් තිබෙන දේශීය කර්මාන්ත පවා ඇනහිටීමේ අනතුරකට මුහුණ දෙන්න සිදුවෙනවා. ඒ නිසා ඒ දේශීය කර්මාන්තකරුවන් ආරක්ෂා කර ගැනීමේ ප්‍රතිපාදන සහිතවයි ආනයන වෙළෙඳපොළ විවෘත කළ යුත්තේ කියලා අපි කල්පනා කරනවා.

මේ මගින් විය හැකි ඊළඟ අනතුර මේකයි. දැන් අපි විශාල අසීරුතාවකට මුහුණ දෙමින් තිබෙනවා. ඒ දැනුම සහිතව නිෂ්පාදන කරන ලද ශ්‍රමිකයා රට අත්හැර යාමේ ප්‍රවණතාවක් ඇති වී තිබෙනවා. ඒ නිසා කර්මාන්ත නැවත පණ ගැන්වීම සඳහා සැලසුම් හදලා ක්‍රියාත්මක කිරීමේදී විය හැකි දේ තමයි, ඒ පණ ගැන්වීම සඳහා අවශ්‍ය වන නිපුණතා සහිත ශ්‍රමය ලංකාවෙන් පිටතට යාමේ අනතුරට මුහුණ පෑමට සිදුවීම. ඒ නිසා ඒ පිළිබඳවත් අමාත්‍යාංශය කල්පනා කළ යුතුයි කියලා මා හිතනවා.

"දේශීය කර්මාන්ත තමයි අපේ ආර්ථිකයේ එන්ජිම. මේක තමයි ඉස්සරහට ගෙන යන්නේ. සුළු හා මධ්‍ය පරිමාණ ආර්ථිකය තමයි අපේ රටේ කොඳු නාරටිය"කියලා අපි හැමදාම ඇති තරම් වාක්‍ය මේ පාර්ලිමේන්තුවේ කියා තිබෙනවා. ඒ ගැන අපි දිගු කාලීන සැලසුම්වලින් කථා කරමු; සැලසුම් හදමු; ඒ ගැන අපේ අදහස් ගනිමු. හැබැයි, දැන් අපි මුහුණ දී තිබෙන්නේ දිගු කාලීන ආර්ථික සැලසුමක් පිළිබඳ ප්‍රශ්නයකට නොවයි. දැන් මේ දේශීය කර්මාන්තයේ නියැළෙන කණ්ඩායම දේශීය ව්‍යවසායකයන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් මේ නිශ්චිත මොහොතේ මුහුණ දී තිබෙන ගැටලුවලට ඉක්මන් පිළියම් අවශ්‍යයි.

## මේ පාලකයන්... 05 වැනි පිටුවෙන්

විට වැඩිම ඉල්ලුමක් සහිත හෙද සේවයක් පවතින්නේ. මේ තත්වය නිසා අපේ රටේ රෝහල්වල හෙද සේවයේ කාර්ය මණ්ඩලයත් රට අත්හැර යන්න පටන්ගෙන තිබෙනවා. අතුරු වෛද්‍ය සේවයේ අයත් රට අත්හැර යනවා. වැඩි වන බඩුමිල සහ ප්‍රධානම වියදම් හමුවේ තම ජීවිත පවත්වාගෙන යාම අර්බුදයකට ලක්වූ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ අය පවා රැකියාව අත්හැර යන තත්වයක් උදාවෙලා තිබෙන්නේ. මේ නිසා මුළු සෞඛ්‍ය සේවාවම ස්වභාවික මරණයකට පත්වෙන්න ඉඩහැර මේ පාලකයන් බලා සිටිනවා.

*නියමුවා:- ජාතික ජන බලවේගය මේ තත්වය ලබාදෙන විසඳුම මොකක්ද?*

*වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා:-* නව ලිබරල් ආර්ථිකයේ ප්‍රධානම ලක්ෂණය වී තිබෙන්නේ සමාජ සුබසාධනය හා සමාජ ආරක්ෂණය කප්පාදු කිරීමයි. නිෂ්පාදන ආර්ථිකය බිඳ දැමීමයි. දශක කිහිපයක් පුරාවට ආණ්ඩුව, සමාජ ආරක්ෂණය, සහ වගකීමෙන් ඈත්වීමේ ප්‍රතිඵලය අද වෙන විට මේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේත්, අධ්‍යාපන ක්ෂේත්‍රයේත් ඇතිවී තිබෙන ගැටලුවලට හේතුව වී තිබෙනවා. සමාජ ආරක්ෂණයෙන් ආණ්ඩුව අයින් වීම නිසා සමාජ ආරක්ෂණයේ වගකීම පැවරෙන්නේ පුද්ගලික වගකීමක් හැටියට. එවිට තමන්ගේ ආරක්ෂණයත්, තමන්ගේ සාර්ථකත්වයටත් සම්පූර්ණයෙන්ම වගකිව යුත්තේ "පුද්ගලයාය" කියන අදහස ක්‍රමානුකූලව සමාජය තුළ ගොඩනඟන්න පටන් ගන්නවා.

මේ තත්වය වෙනස් කර නව ලෝක තත්වය ඉල්ලන, මානුෂීය, සමාජමය වටිනාකම් තිබෙන, මානව සම්පත දියුණු කරන, සමාජමය පරිවර්තනයක් රටට ලබා ගත යුතුයි. ජාතික නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීමේ මූලික කාර්යභාරය වෙනුවෙන් අධ්‍යාපනය සහ සෞඛ්‍යය පදනම්න්ම නැවත සකස් කළ යුතුයි. වෙළඳපොළ අවශ්‍යතාවයට අධ්‍යාපනය සහ සෞඛ්‍යය පසුගිය දශක ගණනාවක් ගෙනයමින් තිබුණා. නමුත් එය වෙනස් කර, මානව සම්පත දියුණු කිරීමේ සහ ආරක්ෂා කිරීමේ අරමුණු සහගතව රජයේ වගකීමක් ලෙස මේ අංශ දෙකම නවීන ලෝකයත් සමග ඉදිරියට ගෙන යා යුතුව තිබෙනවා. ඒ වෙනුවෙන් අදාළ සැලසුම් අපි දැනටමත් සකස් කර තිබෙනවා. ජනතාව හැටියට, පුරවැසියන් හැටියට ක්‍රමානුකූලව සාමූහිකත්වය වෙත ඒකරාශී කරමින් නව ලෝකයත් සමග අප ඉදිරියට ගමන් කළ යුතු වෙනවා.

නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com



ඕස්ට්‍රේලියාවේ පර්ත්හි ජන හමුවක් අතර



ඕස්ට්‍රේලියාවේ කෘෂි නිෂ්පාදන කම්හලක නිරීක්ෂණය



ශිෂ්‍ය වීර දිනය සමරමින්



නෙදර්ලන්ත තානාපතිය සමග




පළාත් පාලන මැතිවරණය ඉල්ලා වීදි බැස



හොඳම දේ දරුවන්ට

# වත්මන් පාලනය පළවා හැරීමේ අඛණ්ඩ අරගලයක් අපිට තිබෙනවා

## ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා



අවුරුදු 75ක් රට පාලනය කළ තමන්ගේ ගමන අවසන් බව පේන නිසා ජනතාවට බලය ගැනීමට පාලකයන් ඡන්දයක් ලබා දීමට සූදානම් නොමැති නමුත් ඡන්දය ලබා ගැනීම සඳහා ජනතාව සංවිධානය කර දැවැන්ත සටනක් කිරීමට සිදු වන බව පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා, රනිල් රාජපක්ෂලා පාලනය පළවා හැරීමේ අඛණ්ඩ අරගලයක් තිබෙන බවත් පාලකයන්ගේ අවසාන මොහොත මෙන්ම ජනතාවගේ ජයග්‍රාහී මොහොත අතහැරීමට සූදානම් නොමැති බව අවධාරණය කළේය.

ලාල්කාන්ත සහෝදරයා මේ බව ප්‍රකාශ කළේ ජාතික ජන බලවේගය විසින් පසුගිය 20වැනි දින අනුරාධපුර නගරයේ සංවිධානය කරන ලද ජනතා උද්ඝෝෂණය අවසානයේ පැවති ජනහමුව අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ලාල්කාන්ත සහෝදරයා මෙසේද පැවසීය.

"මේ නගරයේ ජනතාවටත් රටේ ජනතාවටත් අලුත් දේශපාලන ගමනක් යාමට තිබුණු අවස්ථාව පාලකයන් විසින් නතර කර තිබෙනවා. අවුරුදු 75ක් පැමිණි ගමන වෙනස් කරලා අලුත් ගමනක් යන්න පදනම දැමීමට තිබූ අවස්ථාව නැවැත්වූ රනිල් රාජපක්ෂ පාලනයට ඒ වන්දිය ගෙවන්න වෙනවාමයි. ඒගොල්ලන්ට කියන්න ඕනෑ, ජනතාවගේ අයිතිවාසිකම් නැතිකරලා, බයෙන් ජීවත් වෙයල්ලා. දැන් ඉන්නේ ඡන්දවලින් පැනලා ගිහිල්ලා ජනතාවගෙන් හැංගිලා බයෙන්. රට පුරාම මේ විදිහට දිස්ත්‍රික්කවලට ආසනවලට ගිහින් අපි කියන්න ඕනෑ පාලකයන්ට මේ පෙළගැස්ම හදාගෙන ජාතික අරගලයකට එන බව. එදාට නුඹලාට මේක දාලා යන්න වෙනවා. අපට ඡන්දය තියන්න වෙන්නේ මුන්ව පන්නලා ජනතාවගේ බලයක් යටතේ.

ඡන්දයට සල්ලි මුදාහරින්න කියලා අධිකරණ තීන්දුවක් දුන්නා. අධිකරණය එහෙම තීන්දුවක් දී තිබියදී ඒ තීන්දුවට පයින් ගහලා අධිකරණයට අපහාස කරලා ශ්‍රේෂ්ඨාධිකරණයට ගරු නොකරන පාලනයක් තිබෙන්නේ. ව්‍යවස්ථාව කඩලා, පළාත් පාලන නීති උල්ලංඝනය කරලා යන මේ ගමන භයානකයි. රටට අලුත් ආරම්භයක් ගන්න විදිහක් නැතිව ඉන්නේ මේ පාලකයින් මැතිවරණය හිරකරගෙන ඉන්න නිසයි. මේ ගොල්ලෝ ලෙහෙසියෙන් පළාත් පාලන, පළාත් සභා, මහ මැතිවරණයක් හෝ ජනාධිපතිවරණයක් දෙන්නේ නැහැ. ජාතික ජන බලවේගය දිනනවාය කියන තහවුරුව රටේ තිබෙන තුරු මොන ඡන්දයක්වත් ලේසියෙන් තියන්නේ නැහැ. ඒ නිසා අපි කවුරුත් ජනමතය ශක්තිමත් කර ගනිමින් තවදුරටත් සංවිධානය විය යුතු තැන් සංවිධානය කරමින් රට පුරාම ජනතාව බහුජන අරගලයකට සංවිධානය කරමු. ඒ වෙනුවෙන් අපි හැමදෙනාම අධිෂ්ඨානයෙන් පෙරට එමු."

# මූල්‍ය ක්ෂේත්‍රයේ ගැටලුකාරීත්වයේ පූර්ණ වගකීම ආණ්ඩුව භාර ගත යුතුයි

## ජාතික ජන බලවේගයේ ආර්ථික කවුන්සිල සාමාජික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා




ආර්ථිකය බංකොලොත් කළ ආණ්ඩුව ඊට විසඳුම් සොයනු වෙනුවට, ජනතාව තුළ අවිශ්වාසයක්, සැකයක් නිර්මාණය කර, බැංකු පද්ධතියත් බංකොලොත් කිරීමේ ක්‍රියාවලියක් ගෙන යන බවට චෝදනා කළ ජාතික ජන බලවේගයේ ආර්ථික කවුන්සිල සාමාජික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, තැන්පත්කරුවන්, ණය ගන්නා අය, බැංකුත් සමග ගනුදෙනු කළ යුතු විශ්වාසය වෙනුවට ආණ්ඩුව සැකයක් ඇති කරනවා නම්, ජනතාව ඊට ප්‍රතික්‍රියා දැක්වීම වැළැක්විය නොහැකි බවත් මූල්‍ය ක්ෂේත්‍රයේ ඇතිකර තිබෙන මෙම ගැටලුකාරී තත්වය පිළිබඳ සම්පූර්ණ වගකීම ආණ්ඩුව විසින් භාර ගත යුතුව ඇති බවත් අවධාරණය කළේය.

සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 27 වැනි දින පෙරවරුවේ ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති පැවති ජාතික ජන බලවේගයේ ආර්ථික කවුන්සිලයේ මාධ්‍ය හමුව අමතමිනි.

"ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ තමන්ගේ ගිණුම ගැන පමණක් නොසිතා සමස්තයක් හැටියට සිතා බලන ලෙසයි. මේ අවදානමට ලක්කිරීම ඉතා බරපතළයි. බැංකු අවදානමකට ලක්වෙන කොට, එම බැංකුත් උත්තර සොයන්න ඕනෑ. බැංකුවල හිමිකාරිත්වය ආක්‍රමණය කිරීමකට බලා ඉන්න ජාත්‍යන්තර සහ දේශීය කළු සල්ලි ජාවාරම්කරුවන්ට ඒක හොඳ අවස්ථාවක් වෙනවා. ආණ්ඩුව මේ කරන්න යන්නේ පාර්ලිමේන්තුවෙන් හිස් චෙක්පතකට අත්සන් ගන්නවා වගේ වැඩක්.

සමෘද්ධි ව්‍යාපාරයේ අඩුපාඩු නිවැරදි කිරීම වෙනම ක්‍රියාවලියක්. නමුත් ආණ්ඩුව කරන්න යන්නේ මූල්‍ය අරමුදල දී තිබෙන නියෝග අනුව වැඩිම අවදානමකට ලක්වී තිබෙන පිරිස හැර අනෙක් අය කපා හැරීමයි. අද පංති සීමාවකින් තොරව සෑම කෙනෙක්ම පීඩාවකට පත්වී සිටිනවා. ඇමතිවරුන් වාහන, විදුලි බිල, ඉන්ධන මහජන මුදලින් ලබාගන්නා අතර, මෝටර් සයිකලයක් තිබෙන ගෙවල්වලට ලබාදුන් සහනාධාර කපාහැර තිබෙනවා. මොනතරම් දුෂ්ට ආණ්ඩුවක්ද? ණය කපාහැරීම මගින් රටේ මූල්‍ය පද්ධතිය අස්ථාවර කිරීමේ ක්‍රියාවලියත්, අස්වැසුම මගින් ජනතාව මහ පාරට ඇද දමා තිබෙන තත්වයත් තේරුම් ගන්නා ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිනවා."

# විද්‍යුත් මාධ්‍ය ආණ්ඩුවට හීලෑ කර ගැනීමේ කූට ප්‍රයත්නයට එරෙහි විය යුතුයි

## ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා



මහජන ඡන්දයෙන් පත් නොවූ මහජනයා විසින් ප්‍රතික්ෂේප කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් පත් වූ ජනාධිපතිවරයෙකු විසින් පත් කරන කොමිසමකට, ඒ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ඇමතිවරයාගේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුටත් රටේ මාධ්‍ය ආයතන නියාමනය කිරීමේ බලය ලබා දීමට දැඩිව විරෝධය පළ කරන බව ප්‍රකාශ කළ ජාතික ජන බලවේග යේ ජාතික විධායක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා, මාධ්‍ය මගින් තොරතුරු ලබන සියලු ජනතාවට ආණ්ඩුවේ මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී කූට ප්‍රයත්නයට එරෙහිව පෙළගැසෙන ලෙස ආරාධනා කළේය.

නලින්ද ජයතිස්ස සහෝදරයා මෙසේ ප්‍රකාශ කළේ පසුගිය 05වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වූ ජාතික ජන බලවේගයේ මාධ්‍ය හමුවක් අමතමිනි. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා මෙසේද පැවසීය.

"පසුගිය කාලයේ සමාජයේ තැන් තැන්වල මාධ්‍ය නියාමනය පිළිබඳ සාකච්ඡාවක් තිබුණා. එහෙත් ආණ්ඩුව මාධ්‍ය නියාමනය පිළිබඳ කතිකාවට මුවා වෙලා කරන්න යන්නේ තමන්ගේ දේශපාලන අරමුණු ඉටුකර ගැනීමේ ක්‍රියාවලියක් බව ඉතා පැහැදිලියි. මේ පනත් කෙටුම්පතේ ජාතික ආරක්ෂාව, ජාතික ආර්ථිකය යන වචන සඳහන් කර තිබුණාට ඒ සම්බන්ධයෙන් පැහැදිලි නිර්වචන මෙහි ඇතුළත් වී නැහැ. එහි තේරුම ජනාධිපතිවරයා සහ ආණ්ඩුව විසින් ජාතික ආරක්ෂාව හෝ ජාතික ආර්ථිකය පිළිබඳව සිතන පතන ආකාරය අනුව ඒ වචන දෙකට මුවා වී එම ආයතනවලට එරෙහිව මෙම කොමිසම මගින් නෛතික ක්‍රියාමාර්ග ගත හැකි බවයි. ආණ්ඩුව කෙටුම්පත් කළ ත්‍රස්ත විරෝධී පනත මගින් උත්සාහ දරන දෙය සමාජයට පැහැදිලියි. අයිසීසීපී පනත මගින් අද ආණ්ඩුව කරමින් සිටින්නේ කුමක්ද යන්නත් ඉතාම පැහැදිලියි.

ජනතාවට සත්‍ය තොරතුරු ගලා ගෙන යාම අඩාල කරන්න ආණ්ඩුවට දේශපාලනික අධිෂ්ඨානයක් තිබෙනවා. මේ පනත, විද්‍යුත් මාධ්‍ය ආණ්ඩුවට අවශ්‍ය ආකාරයකට පාලනය කර ගැනීම සඳහා ඒවා තුළ චිප් එකක් තැන්පත් කරනවා වගේ වැඩක්. මාධ්‍ය ආයතනවලට කරනු ලබන තර්ජනයක්.

ආණ්ඩුවට හීලෑ වූ ප්‍රවේශයකට යාමට මෙමු මාධ්‍ය ආයතන හිමිකාරිත්වයට සිදුවනවා. ආණ්ඩුව මෙම කොමිසමේ අවශ්‍යතාව වර්ණනා කරන්නේ බක ජාතකයේ කොකා 'පස් පියුමෙන් සුසැදි විල' ගැන මාළුවන්ට කියූ පරිදියි."

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.